කාර්යසාධන වාර්තාව **2023**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 283

වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

අන්තර්ගතය

අන්තර්ගතය.....iii

වගු ලැයිස්තුව v

ඡායාරූප ලැයිස්තුව vi

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැදින්වීම 1

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර.....3

1.3 ප්‍රධාන කාර්යයන් 4

1.4 සංවිධාන සටහන 5

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 7

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 11

2.1 ලබාගන්නා ලද ප්‍රගතිය 11

2.2 2023 වසරේ ක්‍රියාත්මක විශේෂ වැඩසටහන් **(**විශේෂ අයවැය යෝජනා වැඩසටහන**).....37**

2.3 2023 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවූ අභියෝග.....41

2.4 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනාගත දැක්ම 42

03 පරිච්ඡේදය

2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 43

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 43

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 44

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 45

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 46

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 47

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 47

3.7 මු.රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන **.48**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය.....49

3.9 විගණකාධිපති වාර්තාව 50

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක 69

4.1 කාර්යසාධන දර්ශක **70**

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **74**

5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **74**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග **82**

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ **83**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය **84**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් බලපාන ආකාරය **84**

6.3 මානව සම්පත් සංවර්ධනය **84**

6.4 දේශීය/ විදේශීය පාඨමාලා **85**

6.5 2023 වසරේ විශ්‍රාම ගැනීම් **888**

6.6 සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුරු වලින් නිදහස් වීම **88**

6.7 මියගිය නිලධාරීන් පිළිබඳ විස්තර **88**

6.8 විනය කටයුතු **88**

6.9 සේවය අත්හැර යාම් **89**

6.10 දෙපාර්තමේන්තු විභාග **89**

6.11 පුහුණු වැඩසටහන් **89**

6.12 ණය ලබාදීම **90**

6.13 තොරතුරු අයිතිවාසිකම් ඒකකය **91**

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව **92**

7.1 අනුකූලතා වාර්තාව **922**

වගු ලැයිස්තුව

වගුව 2.1 : දෙපාර්තමේන්තු වැඩසටහන - 2023- නඩත්තු 12
වගුව 2. 2 : නව වන කළමනාකරණ සැලසුම්, සාර්ව වන කළමනාකරණ සැලසුම් හා වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම 14
වගුව 2.3 : වනාන්තර මැනුම් කිරීම 15
වගුව 2.4 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2021 /2022 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම 16
වගුව 2.5 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2023 වසරේ ස්ථාපනය කරන ලද වෙරළ වන වගා නඩත්තු කිරීම 17
වගුව 2. 6 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2023 වසරේ වෙරළ වන වගා ස්ථාපනය කිරීම 17
වගුව 2. 7 : දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන් 18
වගුව 2. 8 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගෙවතු සංවර්ධනය කිරීම 19
වගුව 2. 9 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ බීජ පැළ නිෂ්පාදනය කිරීම 20
වගුව 2. 10 : දීප ව්‍යාප්ත රුක් රෝපණ වැඩසටහන් 20
වගුව 2. 11: පයිනස් වනවගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම 22
වගුව 2. 12 : පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන 2023 23
වගුව 2. 13 : බීජ පැල නිෂ්පාදනය 2023 24
වගුව 2. 14 : සංචාරක බංගලා වලින් ලද ආදායම 2023 24
වගුව 2.15 : පාරිසරික සංචාරක අංශයේ 2023 වසරේ ආදායම 29
වගුව 2. 16 : මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන් 37
වගුව 4.1 : කාර්යසාධන දර්ශක 70
වගුව 5.1 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 74
වගුව 6. 1 : සේවක සංඛ්‍යා කළමනාකරණය 84
වගුව 6. 2 : 2023 වසරේ බඳවාගැනීම් 84
වගුව 6. 3 : දේශීය / විදේශීය පාඨමාලා 85
වගුව 6. 4 : 2023 වසරේ විශ්‍රාම ගැනීම් 888
වගුව 6. 5 : සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරු වලින් නිදහස් වීම 88
වගුව 6. 6 : මියගිය නිලධාරීන් පිළිබඳ විස්තර 88
වගුව 6. 7 : විනය කටයුතු 88
වගුව 6. 8 : සේවය අත්හැර යාම් 89
වගුව 6.9 : පුහුණු වැඩසටහන් 89
වගුව 7. 1 : අනුකූලතා වාර්තාව 92

ඡායාරූප ලැයිස්තුව

රූපය 2.1 : පැළ තවාන් නඩත්තුව 16
රූපය 2.2 : පැළ තවාන් සංවර්ධනය කිරීම 17
රූපය 2 .3 : වෙරළ වන වගා ස්ථාපනය කිරීම.....18
රූපය 2.4 : වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම 18
රූපය 2.5 : ගෙවතු සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.....19
රූපය 2.6 : පාසල් , රාජ්‍ය , පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් ඇති කිරීම 21
රූපය 2.7 : ගල්ඔය පාරිසරික උද්‍යානය තුල පිහිටි අභ්‍යන්තර මාර්ග කි.මී. 6ක් සංවර්ධනය.....26
රූපය 2. 8 : ගල්ඔය පාරිසරික වන උද්‍යානය තුල පිහිටි ප්‍රධාන සඤාරි ජීප් රථ මාර්ගයේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම.....26
රූපය 2. 9 : හුරුළු පාරිසරික වන උද්‍යානය තුල පිහිටි කි.මී.13.5ක් වූ සඤාරි ජීප් රථ මාර්ගයේ බොරළු අතුරා තැලීම.....26
රූපය 2.10 : ඇල්ල රොක් කඳවුරු භූමිය ඉදි කිරීම 27
රූපය 2.11 : එක්ගල් ඔය සංචාරක කඳවුර අලුත්වැඩියාව.....27
රූපය 2.12 : අඩාහැලෙන ඇල්ල නව ප්‍රවේශ පත්‍ර කවුළු ඉදි කිරීම 27
රූපය 2.13 : කණ්ඩලම නව කඳවුරු භූමියක් ඉදි කිරීම.....28
රූපය 2.14 : කෘෂි වන වගා ස්ථාපනය.....38
රූපය 2.15 : ගෙවතු සංවර්ධනයකිරීම.....39

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම කාර්යභාරය සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2023 වර්ෂය තුළ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති පරිදි පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

•සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රශස්ථ වන ආවරණයක් පවත්වා ගැනීම.

•රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම හා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා නිෂ්පාදන වන වගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.

•ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා වන සංරක්ෂණ ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.

•රජයේත්, ප්‍රජාවගේත්, පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් තුරු වැස්ම ඉහළ නැංවීම.

•පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.

•ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු ව්‍යාප්ත කිරීම.

•පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

•වන නිෂ්පාදන හා සේවාවන් තිරසාර ලෙස භාවිතය හා කළමනාකරණය කිරීම.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 13ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් (i) සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති (ii) වන විද්‍යා සහ වන වගා කළමනාකරණ (iii) භූ විද්‍යා තොරතුරු හා වන සංගණන (iv) පරිසර කළමනාකරණ හා භූ සම්පත් (v) පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු (vi) වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම (vii) සැලසුම් හා ප්‍රගති පාලන (viii) පාරිසරික සංචාරක (ix) ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ (x) ප්‍රවාහන අංශය (xi) මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන (xii) මුදල් අංශය (xiii) අභ්‍යන්තර විගණන යන අංශ ඒ යටතට ගැනේ.

මෙම අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් ඉදිරියේ දක්වා ඇති පරිච්ඡේද මඟින් විස්තර කෙරේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්ක වල පිහිටි දිසා වන කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු කොළඹ, රත්නපුරය, නුවරඑළිය, අනුරාධපුරය සහ වව්නියාව යන දිස්ත්‍රික්ක වල ස්ථාපනය කර ඇති කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී සිදු කරයි. පර්යේෂණ කටයුතු කුඹල්පොල සහ බදුල්ල යන ස්ථාන වල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන වල අධීක්ෂණය හා සම්බන්ධීකරණය යටතේ සිදු කෙරේ.

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර

දැක්ම

රටවැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් වන ද්‍රව්‍ය සඳහා වැඩී එන ඉල්ලුම සපුරාලීම මෙන් ම මනා පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසාර අයුරින් කළමණාකරණය කිරීම.

මෙහෙවර

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

•මනා දේශගුණික තත්ත්වයන් මෙන් ම පස, ජල සම්පත්, සතුන් හා වෘක්ෂලතා සංරක්ෂණය හා රටෙහි සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, ඓතිහාසික, විනෝදාත්මක හා සමාජ ආර්ථික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රශස්ත හා ප්‍රමාණවත් වන ආවරණයක් දිවයිනෙහි පවත්වාගෙන යාම.

•වනබිම් සතු භූමි ලක්ෂණ, වන සතුන් හා වෘක්ෂලතා, ඓතිහාසික, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, පාරිසරික හා සමාජීය ලක්ෂණ සැලකීමට ගත් ඒකාබද්ධ භූමි පරිශීලනය මඟින් වන බිම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

•වන වගා බිම් සංවර්ධනය මඟින් දේශීය පරිභෝජනය සඳහා මෙන් ම අපනයනය සඳහා අවශ්‍ය වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම සහ එමඟින් පාංශු හා ජල සම්පත් සංරක්ෂණය සහතික කිරීම.

•අනාගත දැව අවශ්‍යතා අඛණ්ඩව සපුරා ගැනීම උදෙසා වන සම්පත් විද්‍යාත්මක පදනම්න් කළමනාකරණය කිරීම සහ ඒවායේ තිරසාර සංවර්ධනය සහතික කිරීම.

•වන සම්පත් තිරසාර සංවර්ධනයට ලක් කිරීම සඳහා අවශ්‍ය වන, වන විද්‍යා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

•වන සම්පත් සංවර්ධනය උදෙසා දායකවන්නා වූ අනෙකුත් ආයතන සමඟ වෘත්තීය මට්ටමින් සම්බන්ධතා පවත්වාගෙන යාම.

•ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නංවාලීම උදෙසා වන සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය ඉලක්ක කොටගත් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාවට නැංවීම.


•වන සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ අවබෝධය හා හැකියාවන් ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනික හා ව්‍යාප්ති වැඩසටහන් මෙහෙයවීම.

•තත්කාලීනව බලපවත්නා වන සංරක්ෂණ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව වන සම්පත් ආරක්ෂා කිරීම.

•ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම.

•පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් වන සංවර්ධන ක්‍රියාවලීන් ප්‍රවර්ධනයට පියවර ගැනීම.

1.4 සංවිධාන සටහන


වන සං.ජ.
අති වන.සං.ජ.(මෙහෙයුම්)
අති වන.සං.ජ.(අධ්‍යාපන)
අති වන.සං.ජ.(පරිපාලන)
වන සං (ව. ආ. නි.ක්‍රි..)
වන සං (පරි.ක.භූ. ස)
වන සං (ව. වි. ව. ව)
වන සං (ස. ව. වි. වෘ)
වන සං (සැ.ඡා.ප්‍ර.පා)
වන සං (පා.ස)
වන සං (පෙ වි ප සං)
වන සං (හ වි නො)
වන සං (පර්යේෂණ
වන සං (අ. ධා. සං)
වන සං (සි.පා)
ප්‍ර.ග
ප්‍ර.අ.වි.
නි.ව.සං.-කලාප (05)
නි.ව.සං. (02)
නි.ව.සං. (01
ග-II - 01
නි.නි.
ස.ව.සං
ස.ව.සං/දි.ව.නි.(23)
ගණකාධි. III
ස.ව.සං
ස.ව.සං
ස.ව.සං
වි.ව.පා.
පරි. නි
පරි. නි
පරි. නි
පරි. නි
භාෂා පරි.
සං.නි
ව.පා.
සං.නි
සං.නි
සං.නි
සං.නි
ක.සේ.නි.
අ.ව.නි.
සැ.ශි.
ප්‍රස්තකාලාධි.
ක.සේ.නි.
ක.සේ.නි.
ක.සේ.නි.
ක.සේ.නි.
බී .ව.නි
ව.වෘ.නි.
වන.ක්.ස
ව.ගා.ක./ කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස

කෙටි යෙදුම්

වන.සං.ජ	-	වන සංරක්ෂක ජනරාල්
අති.ව.සං.ජ (මෙහෙයුම්)	-	අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ)
අති.ව.සං.ජ (අධ්‍යාපන)	-	අතිරේක වන සංරක්ෂක ජනරාල් (අධ්‍යාපන,පර්යේෂණ හා පුහුණු)
අති.ව.සං.ජ (පරිපාලන)	-	අතිරේක වන සංරක්ෂක ජනරාල් (මානව සම්පත් කළමනාකරණ, පරිපාලන හා ආයතන සංවර්ධන)
වන.සං (පරි.ක.භූ.ස)	-	වන සංරක්ෂක (පරිසර කළමණාකරණ හා භූ සම්පත්)
වන.සං (සැ.ප්‍ර.පා)	-	වන සංරක්ෂක (සැලසුම් හා ප්‍රගති පාලන)
වන.සං (ව.වි.ව.ව.ක)	-	වන සංරක්ෂක (වන විද්‍යා හා වන වගා කළමනාකරණ)
වන.සං (ස.ව.වි.ව.ව්‍යා)	-	වන සංරක්ෂක (සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති)
වන.සං (ව.ආ.නී. ක්‍රි).	-	වන සංරක්ෂක (වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම)
වන.සං (පා.ස)	-	වන සංරක්ෂක (පාරිසරික සංචාරක)
වන.සං (ජෛ.වි.ජ.සං)	-	වන සංරක්ෂක (ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ)
වන.සං (භූ.වි.තො.වන.සං)	-	වන සංරක්ෂක (භූ විද්‍යා තොරතුරු හා වන සංගණන)
වන.සං (පර්යේෂණ)	-	වන සංරක්ෂක (පර්යේෂණ)
වන.සං (අ.ධා.සං)	-	වන සංරක්ෂක (අධ්‍යාපන හා ධාරිතා සංවර්ධන)
වන.සං - (පි.පා)	-	වන සංරක්ෂක (පිරිස් හා පාලන)
ප්‍ර.ග	-	ප්‍රධාන ගණකාධිකාරී
ප්‍ර.අ.වි	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක
නී.නි	-	නීති නිළධාරී
නි.ව.ස	-	නියෝජ්‍ය වන සංරක්ෂක
ගණකාධි. - ii	-	ගණකාධිකාරී
ස.ව.සං.	-	සහකාර වන සංරක්ෂක
ගණකාධි. - iii	-	ගණකාධිකාරී
පරි.නි	-	පරිපාලන නිළධාරී
වි.ව.පා	-	විශේෂ වන පාලක
භාෂා පරි.	-	භාෂා පරිවර්තක
සං.නි	-	සංවර්ධන නිලධාරී
ක.සේ.නි	-	කළමනාකරණ සේවා නිලධාරී
අ.ව.නි	-	අඩවි වන නිලධාරී
පුස්තකාලාධි.		පුස්තකාලාධිපති
සැ.ශි	-	සැලසුම් ශිල්පී
බී.ව.නි	-	බීට්ටු වන නිලධාරී
ව.ව්‍යා.නි	-	වන ව්‍යාප්ති නිලධාරී
ව.ක්.ස	-	වන ක්ෂේත්‍ර සහකාර
ව.ගා.ක	-	වගා කම්කරු
කා.කා.ස	-	කාර්යාල කාර්ය සහයක

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ 13 යටතේ පාලනය වේ.

1.5.1: සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය

ජාතික මට්ටමේ වන ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන් ම සියලු ම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩසටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, වන ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම හා ඒ සඳහා බීජ පැළ නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ ප්‍රජාව සඳහා නියමු මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනා දී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම ද පැවරී තිබේ. ස්වාභාවික වනාන්තර වල සිදු කරන ප්‍රජා වන කළමනාකරණ කටයුතු වල වගකීම ද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය. තව ද අයවැය යෝජනා මත වන ඝණත්වය වැඩි කිරීම සඳහා ලබා දුන් විශේෂ මුදල් ප්‍රතිපාදන යටතේ විශේෂ වන වගා ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් රැසක් ද මෙම අංශය යටතේ පාලනය කරනු ලැබේ.

1.5.2: පරිසර කළමනාකරණ හා භූ සම්පත් අංශය

වන ප්‍රතිපත්තියේ මූලික අරමුණක් වන පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමේ අරමුණ මත පිහිටමින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා සියලු පරිසර පද්ධතීන්හි ජෛව විවිධත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික ආගමික හා සෞන්දර්යාත්මක අගයයන් සංරක්ෂණය කරමින් කළමනාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. තව ද වනාන්තර කළමනාකරණ සැලසුම් සකස් කිරීම, භූ සම්පත් සමීක්ෂණය හා තිරසාර භාවිතය සඳහා වූ සැලසුම් සකස් කිරීම ද මෙම අංශය යටතට ගැනේ.

1.5.3: වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන් ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත් ද, සුරැකීම සහ සංරක්ෂණය කිරීම සඳහා වූ නීතිමය පසුබිම සැකසීම වේ. එමඟින් වනාන්තර වලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත් වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීම, ප්‍රාදේශීය කාර්ය මණ්ඩල හදිසි වැටලීම් අංශය සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම මෙන් ම ආරක්ෂිත ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රකාශයට පත් කිරීම සහ වන සංරක්ෂණ අඥා පනත සඳහා නියෝග සකස්කිරීම ද මෙම අංශය සතු වගකීම් වේ.

1.5.4: භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය

භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය ප්‍රධාන වශයෙන් රටේ වන සම්පත් ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමේ වගකීම දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ පවතින වනාන්තර මිනුම් කිරීම සහ සිතියම් සැකසීම, වනාන්තරවල මායිම් සලකුණු කිරීම, ස්වාභාවික සහ ස්ථාපිත වනාන්තරවල සංගණනයන් සිදු කිරීම, වන වගාවන් වල සංගණන දත්ත අඩංගු දත්ත සමුදාය පවත්වාගෙන යාම, වන ආවරණ සිතියම් සැකසීම, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් වලට අවශ්‍ය අංකිත සිතියම් සැකසීම, වනාන්තර රක්ෂිත බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය උපලේඛන සැකසීම හා ඒවා පරීක්ෂා කිරීම වේ. තව ද පැරණි ගුවන් ඡායාරූප, අංකිත දත්ත, භූ සිතියම්, ගුවන් ඡායාරූප ලබාගත් රේඛාවන් දක්වන භූ සිතියම් ආරක්ෂිතව ගබඩා කර තැබීම ද මෙම අංශයේ වගකීමක් වේ.

1.5.5: සැලසුම් හා ප්‍රගති පාලන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික අයවැය සකස් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම මෙන් ම ගොඩනැගිලි ඉදි කිරීම, අධීක්ෂණය සහ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ දියුණු කිරීම යන ක්‍රියාකාරකම් ද සැලසුම් හා ප්‍රගති පාලන අංශය විසින් සිදු කරනු ලැබේ.

1.5.6: පාරිසරික සංචාරක අංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රමෝපායන් හි ප්‍රමුඛතම අංශයක් වන සංචාරක කර්මාන්තයට ඉහළ දායකත්වයක් ලබාදිය හැකිවන්නා වූ පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන්නා වූ ස්වභාවික වනාන්තර ආශ්‍රිතව ඉතා ඉහළ විභවයක් ඇත. තව ද පාරිසරික සංචාරක කර්මාන්තය මඟින් වනාන්තර ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඇති ඉහළ විභවය නිසි පරිදි කළමනාකරණය කර ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම සඳහා ද පාරිසරික සංචාරක කර්මාන්තය යොදා ගැනීමට හැකියාව තිබේ.

පාරිසරික සංචාරක කර්මාන්තය සමඟ බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් සහ සංචාරකයින් සමඟ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ද යොදාගැනීමට හැකියාව ඇත. මේ සඳහා සංචාරකයින්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන එම අවශ්‍යතා සැපයීමට දෙස් විදෙස් සංචාරකයින් විශාල ලෙස ආකර්ශණය කර ගැනීමට හැකියාව ඇත. ඒ අනුව, පරිසර පද්ධති සංරක්ෂණය තහවුරු කර ගනිමින්, ප්‍රජාවගේ සුභ සිද්ධිය සැලසීම සහ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා පාරිසරික සංචාරක ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ වගකීම වේ.

1.5.7: වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශය

දැව නිෂ්පාදන හා සේවා සැපයීම තහවුරු කරමින් තිරසාර ලෙස වන වගා කළමනාකරණය කිරීම වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වේ. වන වගා ස්ථාපනය කිරීම හා කළමනාකරණය, අස්වනු නෙලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත වන වගා නිදහස් කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම අංශය දායක වේ. පයිනස් වගා බිම්වලින් පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් රෙසින් නිස්සාරණය කිරීම සහ පුද්ගලික අංශය සමග නැවත වගා කිරීමේ කටයුතුවල නිරත වීම මෙම අංශයේ අනෙකුත් වගකීම් වේ.

1.5.8: ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශය

ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශයේ අරමුණ වනුයේ ජෛව විවිධත්වය, පස, ජලය කෙරෙහි අවධානය යොමු කරමින් අනාගත පරපුර වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමය. වන ආවරණය වැඩි කිරීම හා සංරක්ෂණය කිරීම, වන ආවරණය වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම, ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගනිමින් වන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කඩොලාන නැවත වගා කිරීම හා පවතින කඩොලාන පද්ධතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, කැළෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වැව් තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම යනාදී ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

1.5.9: පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු අංශය

පර්යේෂණ, අධ්‍යාපන සහ පුහුණු අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුළ, පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.මේ යටතේ පර්යේෂණ අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වලින් ද, අධ්‍යාපන අංශය, නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය යන අංශ මඟින් ද පාලනය වේ.

වන විද්‍යා පර්යේෂණ ආයතනය මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩසටහන, පර්යේෂණ මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ ගැටළු නිරාකරණය කිරීමෙහිලා සෘජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින් සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යා සම්බන්ධ ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩල හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් (NVQ 5 සහ 6 මට්ටමේ) ආශ්‍රිත පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් සිදු කරනු ලබයි. තව ද පුද්ගලික අංශයෙන් සහ රජයේ වෙනත් නියෝජිත ආයතනවලින් සිදුකරන ඉල්ලීම්වලට අනුව කෙටි කාලීන පුහුණු වැඩසටහන් සිදුකරනු ලැබේ. දඹුල්ල ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමණාකරණ ව්‍යාපෘතියේ ආධාර යටතේ අළුතින් ඉදිකර ඇත.

1.5.10: ප්‍රවාහන අංශය

මෙම අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, සංචිතයේ තිබෙන වාහන වලට සහ නිලධාරින්ට වෙන් කරන ලද වාහන වලට ඉන්ධන සැපයීම සහ රියදුරන්ගේ අතිකාල, අමතර ප්‍රවාහන ඉන්ධන ඉල්ලීම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම යනාදී කටයුතු සඳහා වගකියනු ලැබේ. මෙයට අමතරව, ප්‍රධාන කාර්යාලයට හා අනෙකුත් ක්ෂේත්‍ර කාර්යාලවලට අයත් වාහන ගර්හිත කිරීම, අළුත්වැඩියා කටයුතු සඳහා සහ ඉන්ධන සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැපයීම ද ප්‍රධාන කාර්යාලයේ වාහන සේවා කිරීමේ කටයුතු හා රක්ෂණය කිරීමේ කටයුතු ද, සියලුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍ර කාර්යාලවල වාහන වල සිදු වන අනතුරු සම්බන්ධව කටයුතු කිරීම ද මෙම අංශය මඟින් සිදු වේ

1.5.11: මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමස්ථ පරිපාලන කටයුතු සිදු කිරීම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. එමෙන් ම මහජනයාට උපරිම සේවාවක් සැපයීම උදෙසා පරිපාලන සහ කළමනාකරණ වැඩ රාමු තුළ තම සේවාව මනාව ඉටු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, දිසා වන කාර්යාල, අඩවි වන කාර්යාල, වන විද්‍යාලය හා පර්යේෂණ මධ්‍යස්ථාන වල සේවයේ නියුතු මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

පිරිස් හා පාලන යන විෂයයන්ට අදාළ කටයුතු මෙම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් චක්‍රලේඛ විධි විධාන සහ අදාළ නීති, රෙගුලාසි සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුළත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි වලට අනුකූලව සියලු බඳවා ගැනීම්, උසස් වීම් හා අනෙකුත් වරප්‍රසාද ලබා දීම් සිදු කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කෙරේ.

1.5.12: මුදල් අංශය

දෙපාර්තමේන්තුවට අදාළ මූල්‍යමය කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ මුදල් අංශය මඟිනි. මෙම අංශය මහා භාණ්ඩාගාරය, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැලසුම් කිරීම, මෙහෙයවීම, පාලනය හා ගිණුම් තැබීම, මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් සහ දෙපාර්තමේන්තු ආදායම් සම්බන්ධ මූල්‍ය පාලනය, මහා භාණ්ඩාගාරයට සහ දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරීත්වයට අවශ්‍ය මූල්‍යමය තොරතුරු වර්ගීකරණය කර ඉදිරිපත් කිරීම, විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සහ දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින කැළෑ ගිණුම් සම්බන්ධ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම මුදල් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.5.13: අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ VII වන කොටසේ 40 වන වගන්තිය මෙන්ම, මුදල් රෙගුලාසි සංග්‍රහයේ වගන්ති අංක 133,134 හා අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව ඉටු කරනු ලබන රාජකාරි කටයුතු පිළිබඳ තොරතුරු වන සංරක්ෂණ ජනරාල් වෙත සෘජුවම වාර්තා කරනු ලබයි.

දෙපාර්තමේන්තු කාර්යයන්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව සිදුවේ ද යන්න පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම තුලින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහල නංවා ගැනීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන විධිවල ප්‍රමාණාත්මකභාවය ඇගයීමකට ලක් කොට එහි තත්ත්වයන් පිළිබඳ වන සංරක්ෂක ජනරාල් වෙත වාර්තා කිරීම සිදු කරයි.

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ලබාගන්නා ලද ප්‍රගතිය

වන සංරක්ෂණය හා සංවර්ධනය මූලික කරගත් කාර්යයන් සමුදායක් 2023 වසර තුළ දියත් කළ අතර ඒවායේ කාර්යසාධනය පහත අංශ ඔස්සේ විස්තර කෙරේ.

2.1.1 හානියට පත් වනාන්තර නැවත ප්‍රතිස්ථාපනය කිරීම

2.1.1.1 ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලද වනාන්තර නඩත්තු කිරීම (ANR)

ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්.265 , අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්.240 ,මඩකලපුව දිස්ත්‍රික්කයේ හෙක්.25 , පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හෙක්.280, ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික්කයේ හෙක්.225 , කළුතර දිස්ත්‍රික්කයේ හෙක්.15 , කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙක්.305,පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්.403 , බදුල්ල දිස්ත්‍රික්කයේ හෙක්. 86 ,මහනුවර දිස්ත්‍රික්කයේ හෙක්.22.5 , මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 165, මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්. 320 , නුවරඑළිය දිස්ත්‍රික්කයේ හෙක්.20 , ගාල්ල දිස්ත්‍රික්කයේ හෙක්. 88, හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෙක්.230, මාතර දිස්ත්‍රික්කයේ හෙක්.119 ,රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්.190, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ හෙක්.250 , මන්නාරම දිස්ත්‍රික්කයේ හෙක්. 210 ,මුලතිව් 170 ,සහ වව්නියාව දිස්ත්‍රික්කයේ හෙක්.305 ලෙස පසුගිය වසර වල ආරම්භ කරන ලද ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ වැඩසටහන යටතේ හෙක්.3933 භූමි ප්‍රදේශයක නඩත්තු කටයුතු සිදු කරන ලදි.

2.1.1.2 ප්‍රතිෂ්ඨාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම

ප්‍රතිස්ථාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම යටතේ අනුරාධපුර හෙක්.50 ත්‍රිකුණාමලය හෙක්.5, මොණරාගල හෙක්.10,මාතලේ හෙක්.80,කළුතර හෙක්.37.46, රත්නපුර හෙක්.67.5, වව්නියාව හෙක්.10, මුලතිව් හෙක්.20,මන්නාරම හෙක්.50, කිලිනොච්චි හෙක්.11.5 ලෙස හෙක්.341.5 භූමි ප්‍රදේශයක ප්‍රතිෂ්ඨාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම් කටයුතු සිදු කරන ලදි.

2.1.1.3 කඩොලාන වනාන්තර පවත්වාගෙන යාම හා නඩත්තුව

පරිහානියට පත්වී ඇති කඩොලාන ප්‍රතිස්ථාපනය යටතේ පසුගිය වසරවල ප්‍රතිස්ථාපන කටයුතු ආරම්භ කරන ලද අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්. 34.5, මඩකළපුව දිස්ත්‍රික්කයේ හෙක්. 55, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 52, ගම්පහ දිස්ත්‍රික්කයේ හෙක්. 01, කළුතර දිස්ත්‍රික්කයේ හෙක්.2.1, පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්.15, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ හෙක්. 87, ,මන්නාරම දිස්ත්‍රික්කයේ හෙක්.55 ලෙස හෙක්. 302.6 භූමි ප්‍රදේශයක කඩොලාන ප්‍රතිස්ථාපන කටයුතු සිදු කරන ලදි

2.1.1.4 රණවිරු රුක්රෝපණය හා නඩත්තුව

රණවිරු රුක්රෝපණ නඩත්තු වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්. 10, මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක් 30, ගාල්ල දිස්ත්‍රික්කයේ හෙක්. 07 ලෙස හෙක්. 47ක භූමි ප්‍රදේශයක රණවිරු රෝපණ නඩත්තු කටයුතු සිදු කරන ලදි.

2.1.1.5 වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත ඉඩම් නඩත්තු කිරීම

වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත ඉඩම් නඩත්තු කිරීම මාතලේ හෙක්. 60, බදුල්ල හෙක්. 25, මොනරාගල හෙක්. 65, නුවර හෙක්. 6, නුවරඑළිය හෙක්. 19.82, පෙළොන්නරුව හෙක්.50, මඩකලපුව හෙක්. 50, අනුරාධපුර හෙක්. 50,ත්‍රිකුණාමලය හෙක්. 50, හම්බන්තොට හෙක්. 50,රත්නපුරහෙක් 30,ගාල්ල හෙක්. 15, වව්නියාව හෙක්. 25, මන්නාරම හෙක්. 35,කිලිනොච්චි හෙක්. 30, කුරුණෑගල හෙක්. 13,කළුතර හෙක්. 16.5, පුත්තලම හෙක්. 32 ක් ලෙස හෙක්. 622.32 භූමි ප්‍රදේශයක වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත ඉඩම් නඩත්තු කිරීම් කටයුතු සිදු කරන ලදි.

2.1.1.6 වනාන්තර බවට පත් කළ අතහැර දමන ලද ගෙවතු ඉඩම් නඩත්තු කිරීම

අතහැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කිරීමේ නඩත්තු කටයුතු සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 130 භූමි ප්‍රදේශයක ප්‍රතිස්ථාපන කටයුතු සිදු කරන ලදි.

2.1.1.7ආක්‍රමණශීලී ශාඛ ඉවත් කිරීම හා එම ප්‍රදේශ නඩත්තු කිරීම

පසුගිය වසර ආක්‍රමණශීලි ශාක ඉවත්කිරීමේ නඩත්තු කටයුතු සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්. 180 නඩත්තු කටයුතු සිදු කරන ලදි.

2.1.1.8 වැව් තාවුළු සංරක්ෂණය සඳහා සිටුවන ලද පැළ නඩත්තු කිරීම

වැව් තාළුලු සංරක්ෂණය සඳහා සිටුවන ලද පැල නඩත්තු කටයුතු සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ හෙක්. 20, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හෙක්. 32 ,ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 25 කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙක්. 05, බදුල්ල දිස්ත්‍රික්කයේ හෙක්. 05 , මහනුවර දිස්ත්‍රික්කයේ හෙක්. 4.5,මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 4.5 , මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 5 ,මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්. 3 ,නුවරඑළිය දිස්ත්‍රික්කයේ හෙක්. 0.2 ,ගාල්ල දිස්ත්‍රික්කයේ හෙක්. 2.4 ,හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෙක්. 01, මාතර දිස්ත්‍රික්කයේ හෙක්. 01 , රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්. 22, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ හෙක්. 15 , මන්නාරම දිස්ත්‍රික්කයේ හෙක් . 20 සහ වව්නියාව දිස්ත්‍රික්කයේ හෙක් . 08 ,අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්. 10, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්. 11.9 ලෙස එකතුව හෙක්. 195 භූමි ප්‍රදේශයක නඩත්තු කටයුතු සිදු කරන ලදි

2.1.1.9 ආගමික ස්ථානවල රුක් සිටුවීම/නඩත්තු කිරීම

ආගමික ස්ථාන වල සිටුවන ලද පැල නඩත්තුව සඳහා අනුරාධපුර මහමෙව්නා උයන තුළ සිටුවන ලද පැළ නඩත්තු කටයුතු සඳහා හෙක්. 04 භූමි ප්‍රදේශයක නඩත්තු කටයුතු සිදු කරන ලදි.

2.1.1.10 දෙපාර්තමේන්තු වැඩසටහන - 2023 - නඩත්තු

වගුව 2.1 : දෙපාර්තමේන්තු වැඩසටහන - 2023- නඩත්තු

කාර්යය	ඉලක්ක-2023 භෞතික (හෙක්.)	ඉලක්ක - 2023 මූල්‍ය (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
ස්වභාවික වනාන්තර පුනර්ජනනය නඩත්තු (ANR Maintain)	3933	79,500,852.00	79,248,664.00	3933
ප්‍රතිස්ථාපිත කඩොලාන වනාන්තර නඩත්තු කිරීම	302	5,411,796.00	5,411,796.00	302
ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම	341.46	12,807,926.00	11,591,400.00	341
රණවිරු රුක් රෝපණ නඩත්තු	47	828,563.00	828,563.00	47

කටු පදුරු සහිත ඉඩම් වල ස්ථාපිත කල වන වගා නඩත්තු කිරීම	623	10,970,256.96	10,970,256.96	622.32
අත්හරින ලද ගෙවතු වල ස්ථාපිත කරන ලද වනාන්තර නඩත්තු කිරීම	130	2,291,640.00	2,291,640.00	130
වැව් තාවුලු වල වගා කරන ලද වනවගා නඩත්තු	195	3,437,655.00	3,326,600.00	195
ආක්‍රමණශීලී ශාක ඉවත් කරන ලද වනාන්තර නඩත්තු කිරීම	180	3,170,340.00	3,056,500.00	180
ආගමික ස්ථාන වල රුක් රෝපණය නඩත්තු (අනුරාධපුර මහමෙව්නා උයන)	4	70,523.04	70,523.04	4
කැලෑ ගිනි පාලනය	-	10,000,000.00	9,957,257.70	-
ලබා දුන් ප්‍රතිපාදන එකතුව		**128,489,552.00**	**126,753,200.70**	

2.1.11 පසුගිය වසරවල විශේෂ වැඩසටහන් යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

පෙර වසරවල විශේෂ වැඩසටහන්වල නඩත්තු කටයුතු දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් සිදුකරනු ලබයි.

2.1.1.12 ගිනි පටි ස්ථාපනය කිරීම

කි.මී. 25ක ගිනි පටි ස්ථාපනය කිරීම.

2.1.1.13 ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ගිනි පාලන වැඩසටහන් 72ක් ක්‍රියාත්මක කිරීම.

2.1.2 වන කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම, සකස් කිරීම සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය

2.1.2.1 නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම ,සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම හා වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම

මෙහිදී 2023 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලස්මට අනුව දිසා වන කාර්යාල 23 මූලික කර ගනිමින් නව වන කළමනාකරණ සැලසුම් 50ක් සකස් කිරීමට තිබූ නමුත් නව වන කළමනාකරණ සැලසුම් 200 සකස් කර අවසන් කර ඇත. එමෙන්ම සිංහරාජ වනාන්තර සංකීර්ණය සඳහා වන සාර්ව වන කළමනාකරණ සැලසුම යාවත්කාලීන කර ඇත. තවද වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 04ක් පවත්වා ඇත. (උතුරු මැද/ නැගෙනහිර කලාපය , උතුරු කලාපය , දකුණු /සබරගමුව කලාපය සහ මධ්‍යම/ ඌව කලාපය සඳහා)

අනු අංකය	වැඩසටහන	**2023.12.31** දින වන විට අවසන් කල යුතු ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය	**2023.12.31** දින වන විට ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ලබා ඇති භෞතික ප්‍රගතිය	**%**
2.1.2.1	ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම	ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 50 ක් සකස් කිරීම.	ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 200 ක් සකස් කර ඇත.	100% +
2.1.2.2	වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම.	සිංහරාජ වනාන්තර සංකීර්ණය සඳහා යාවත්කාලීන කරන ලද සාර්ව වන කළමනාකරණ සැලසුමක් සකස් කිරීම	සිංහරාජ වනාන්තර සංකීර්ණය සඳහා යාවත්කාලීන කරන ලද සාර්ව වන කළමනාකරණ සැලසුමක් සකස් කර ඇත.	100%
2.1.2.3	වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම	වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05 ක් පැවැත්වීම (උතුරු මැද/ නැගෙනහිර කලාපය , උතුරු කලාපය , දකුණ /සබරගමුව කලාපය , වයඹ /බස්නාහිර කලාපය , මධ්‍යම/ ඌව කලාපය) සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය විසින් ප්‍රතිපාදන ලබා දී ඇත.	වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 04ක් පැවත්වා ඇත. උතුරු මැද/ නැගෙනහිර කලාපය, උතුරු කලාපය , දකුණ /සබරගමුව කලාපය ,මධ්‍යම/ ඌව කලාපය) එමඟින් වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම වේගවත් කර ඇත.	80%

2.1.3 ස්ථීර වනාන්තර පද්ධතියක් ස්ථාපිත කිරීම මඟින් දැනට ඇති වනාන්තර ආරක්ෂා කිරීම

2.1.3.1 වනාන්තර මායිම් සලකුණු කිරීම සහ සිතියම් සකස් කිරීම

ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත නිකුත් කර ඇති වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින වනාන්තර සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය යන මැයෙන් වූ අමා/0147/613/002 අංක දරණ 2023.01.31 දිනැති කැබිනට් පත්‍රිකාව සහ තිරසර වනාන්තර කළමනාකරණය තුලින් ඉඩම් ගැටලු නිරාකරණය යන මැයෙන් වූ අමා/23/2367/613/008-1 දරණ 2024.01.02 දිනැති කැබිනට් පත්‍රිකාව මඟින් උතුරු කලාපයේ දිස්ත්‍රික්ක 05,නැගෙනහිර පලාතේ දිස්ත්‍රික්ක 03,උතුරු මැද කලාපයේ දිස්ත්‍රික්ක 02ක් සහ මොණරාගල දිස්ත්‍රික්කය ඇතුලු දිස්ත්‍රික්ක 11ක වනාන්තර මායිම් ගැටලු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට සිතියම් සැකසීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙස දී ඇති උපදෙස් අනුව වනාන්තර මායිම් සලකුණු කිරීම සහ සිතියම් සකස් කිරීමේ ඉලක්ක සම්පූර්ණ කිරීමට නොහැකි වීම.

2.1.3.2 වනාන්තර මැනුම් කිරීම

වගුව 2.3 : වනාන්තර මැනුම් කිරීම

දිසාව	වනාන්තර මායිමේ කණු සිටුවීම (කි.මී.)			වනාන්තර මායිම් GPS මඟින් මැනුම් කිරීම (කි.මී.)			වනාන්තර මායිමේ දැන්වීම් පුවරු සවි කිරීම		
	සංශෝධිත ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය (%)	සංශෝධිත ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය (%)	සංශෝධිත ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය (%)
වව්නියාව	940	0	0	කි.මී. 1600	201	54.57	200	22	246
මුලතිව්					140			-	
කිලිනොච්චිය					90			-	
මන්නාරම					42.5			28	
අම්පාර					131			-	
මඩකලපුව					32.5			22	
ත්‍රිකුණාමලය					140			-	
පොලොන්නරුව					7.45			1	
අනුරාධපුරය					88.8			36	
නුවරඑළිය								32	
ගාල්ල								64	
මාතර								22	
මහනුවර								22	
මාතලේ								18	
කෑගල්ල								30	
බදුල්ල								22	
කළුතර								39	
ගම්පහ								5	
කුරුණෑගල								129	
					873.25			**492**	

2.1.3.3 නාම පුවරු සවි කිරීම

2023 වසරේ දී අපේක්ෂිත ඉලක්කය, නාම පුවරු 200 වුවද,වනාන්තර මායිම් සලකුණු කිරීම සහ සිතියම් සකස් කිරීම මෙම වසරේ සිදු නොවන බැවින් එම ප්‍රතිපාදන ද යොදා ගනිමින් වර්ෂ අවසාන වන විට වනාන්තර මායිමේ දැන්වීම් පුවරු 492ක් සවි කරන ලදී.

2.1.3.4 ජාතික වන සංගණන නියැදි දත්ත ලබා ගැනීම (NFI)

2023 වසරේ දී ජාතික වන සංගණන දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේදී දෙවන චක්‍රය යටතේ 2018 වසරේ දී රැස් කළ නියැදි වලට ගොස් නැවත දත්ත රැස් කිරීම සිදු කරන ලදී.මෙකී ඉලක්කය නියැදි 786ක් වූ නමුත් වර්ෂ අවසානයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය කරා ළඟා නොවූ අතර නියැදි 751ක දත්ත පමණක් ලබා ගැනීමට හැකි විය.ලබාගත නොහැකි වූ නියැදි 2024 වර්ෂයේ ජනවාරි මාසයේ රැස් කිරීමට තීරණය විය.

2.1.3.5 වන වගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා දත්ත රැස් කිරීම

ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත නිකුත් කර ඇති වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින වනාන්තර සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය යන මැයෙන් වූ අමා/0147/613/002 අංක දරණ 2023.01.31 දිනැති කැබිනට් පත්‍රිකාව සහ තිරසර වනාන්තර කළමනාකරණය තුලින් ඉඩම් ගැටලු නිරාකරණය යන මැයෙන් වූ අමා/23/2367/613/008-1 දරණ 2024.01.02 දිනැති කැබිනට් පත්‍රිකාව මඟින් උතුරු කලාපයේ දිස්ත්‍රික්ක 05,නැගෙනහිර පලාතේ දිස්ත්‍රික්ක 03,උතුරු මැද කලාපයේ දිස්ත්‍රික්ක 02ක් සහ මොණරාගල දිස්ත්‍රික්කය ඇතුලු දිස්ත්‍රික්ක 11ක වනාන්තර මායිම් ගැටලු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට සිතියම් සැකසීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙස දී ඇති

උපදෙස් අනුව වනාන්තර මායිම් සලකුණු කිරීම සහ සිතියම් සකස් කිරීමේ ඉලක්ක සම්පූර්ණ කිරීමට නොහැකි වීම.

2.1.4 වන ව්‍යාප්තිය හා දැනුවත් කිරීම්

2.1.4.1 ස්ථාපිත කෘෂි වන වගා පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු

2022 වර්ෂය තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 411.25ක්ද, 2021 වර්ෂය තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 940.1ක්ද විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී.

වගුව 2.4 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2021 /2022 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම

දිසාව	**2021** ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.)	**2022** ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.)
රත්නපුර	37.6	3.6
හම්බන්තොට	2.80	-
අනුරාධපුර	318.30	132.35
පොළොන්නරුව	184.50	10.00
අම්පාර	65.00	35.00
මඩකලපුව	18.00	8.00
මොණරාගල	41.5	50.00
බදුල්ල		52.00
මාතලේ	85.20	55.40
පුත්තලම	45.00	15.00
කුරුණෑගල	142.20	39.90
වවුනියාව	-	10.00
එකතුව	**940.10**	**411.25**

2.1.4.2 පැළ තවාන් නඩත්තුව

මේ යටතේ අනුරාධපුර, අම්පාර, මොනරාගල, නුවර එළිය, මාතලේ, පුත්තලම, කුරුණෑගල, කළුතර, ගම්පහ, කිලිනොච්චිය, රත්නපුර, කෑගල්ල හා හම්බන්තොට යන දිසා වන කාර්යාල වලට අනුබද්ධ පැල තවාන්වල ඉතිරිව ඇති පැල නඩත්තු කිරීම සඳහා කටයුතු කර ඇත.



රූපය 2.1 : පැළ තවාන් නඩත්තුව

2.1.4.3 පැළ තවාන් සංවර්ධනය කිරීම

2023 වර්ෂය තුල මහනුවර, මඩකලපුව, කුරුණෑගල, කළුතර, කිලිනොච්චිය, රත්නපුර, ගාල්ල හා මාතර යන දිසාවන් තුල පිහිටි දෙපාර්තමේන්තු පැළ තවාන් 11 ක් සංවර්ධනය කරන ලදී. එහිදී තවාන් භූමි සැකසීම, තවාන් ප්‍රවේශ මාර්ග පිළිසකර කිරීම, ගබඩා කාමර හා වැසිකිලි ඉදි කිරීම, තවාන් වැට සකස් කිරීම, තවාන සඳහා ජලය සපයාගන්න ලිඳ අලුත්වැඩියා කිරීම, ජල නල පද්ධති අලුත්වැඩියාව හා විසිරුම් ජල සම්පාදන පද්ධති සැකසීම, ජල ටැංකි ස්ථාපනය කිරීම, මව් පාත්ති ස්ථාපනය, ස්ථිර පාත්ති සකස් කිරීම, සෙවණ ගෘහ ඉදි කිරීම, හරිත ගෘහ තැනීම හා අලුත්වැඩියා කිරීම් වැනි ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත.



රූපය 2.2 : පැළ තවාන් සංවර්ධනය කිරීම

2.1.4.4 වෙරළ වන වගා නඩත්තුව

විශේෂ වන වගා වැඩසටහන යටතේ 2022 වර්ෂයේ අම්පාර, කිලිනොච්චිය, මඩකලපුව දිසාවන්හී ස්ථාපිත කරන ලද වෙරළ වන වගා හෙක්ටයාර් 46ක් නඩත්තු කටයුතු සිදුකර ඇත.

වගුව 2.5 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2022 වසරේ ස්ථාපනය කරන ලද වෙරළ වන වගා නඩත්තු කිරීම

දිසාව	වෙරළබඩ වන වගා නඩත්තු ප්‍රමාණය (හෙක්.)	නිපදවූ පැළ සංඛ්‍යාව
මඩකලපුව	10	10,000
අම්පාර	16	48,000
කිලිනොච්චිය	20	1,800
එකතුව	**46**	**59,800**

2.1.4.5 වෙරළ වන වගා ස්ථාපනය කිරීම

2023 වර්ෂයේ අම්පාර, මඩකලපුව, කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක වල වෙරළ වන වගා හෙක්ටයාර් 25ක් ස්ථාපිත කර ඇත.

වගුව 2. 6 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2023 වසරේ වෙරළ වන වගා ස්ථාපනය කිරීම

දිසාව	ස්ථාපිත වෙරළබඩ වන වගා ප්‍රමාණය (හෙක්.)	නිපදවූ පැළ සංඛ්‍යාව
මඩකලපුව	5	13,750
අම්පාර	10	17,600
කිලිනොච්චිය	10	10,000
එකතුව	**25**	**41,350**




රූපය 2.3: වෙරළ වන වගා ස්ථාපනය කිරීම

2.1.4.6 වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම

පරිසර සංරක්ෂණය, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය , ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා පාසල් සිසුන් හා ප්‍රජාව නැඹුරු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගිනි කළමනාකරණ වැඩසටහන්, ශ්‍රමදාන, ක්ෂේත්‍ර චාරිකා, පරිසර කඳවුරු, හා වෙනත් විශේෂ වැඩසටහන් 1064ක් ක්‍රියාත්මක කරන ලදි.

වගුව 2. 7: දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන්

වැඩසටහන් වර්ගය	සංඛ්‍යාව
දැනුවත් කිරීමේ වැඩසටහන්	810
වැඩමුළු	32
ගිනි කළමනාකරණ වැඩසටහන්	43
ශ්‍රමදාන	22
ප්‍රදර්ශන	02
තරඟ	01
ක්ෂේත්‍ර චාරිකා	27
වෙනත් විශේෂ වැඩසටහන්	127
එකතුව	**1,064**




රූපය 2.4: වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම

2.1.4.7 ගෙවතු සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

ගෙවතු 1000ක් සඳහා සුදුසු පැළ සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදී.

වගුව 2. 8 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගෙවතු සංවර්ධනය කිරීම

දිසාව	දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කරන ලද ගෙවතු
රත්නපුර	50
කෑගල්ල	50
ගාල්ල	50
මාතර	50
හම්බන්තොට	50
අනුරාධපුර	50
පොළොන්නරුව	50
අම්පාර	50
ත්‍රිකුණාමලය	50
මඩකලපුව	50
මොණරාගල	40
බදුල්ල	40
නුවරඑළිය	40
මහනුවර	40
මාතලේ	40
ගම්පහ	25
කුරුණෑගල	50
පුත්තලම	25
කළුතර	50
වව්නියාව	50
මන්නාරම	25
මුලතිව්	50
කිළිනොච්චිය	25
එකතුව	**1000**



රූපය 2.5 : ගෙවතු සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

2.1.4.8 බීජ පැළ නිෂ්පාදනය කිරීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන තවාන් පැළ 258,500ක සංඛ්‍යාවක් 2023 වසර තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල නිපදවන ලදී. නිපදවන ලද සම්පූර්ණ තවාන් පැළ සංඛ්‍යාවෙන් පැළ 63,703ක් අලෙවි කරන ලද අතර 73,361ක් විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා හා රාජ්‍ය සහ වෙනත් විවිධ ආයතන වෙත නොමිලයේ ලබාදෙන ලදී. තවත් කොටසක් ජාතික රුක් රෝපණ වැඩසටහන් හා ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා යොදා ගන්නා ලදී.

වගුව 2. 9: දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ බීජ පැළ නිෂ්පාදනය කිරීම

දිසාව	දෙපාර්තමේන්තු බීජ පැළ	
	9*6	**8*12**
රත්නපුර	5500	-
කෑගල්ල	10,000	10,000
ගාල්ල	5000	1000
මාතර	5000	1000
හම්බන්තොට	5000	3000
අනුරාධපුර	10,000	5000
පොළොන්නරුව	5000	5000
ත්‍රිකුණාමලය	5000	3000
මඩකලපුව	5000	5000
බදුල්ල	5000	4000
නුවරඑළිය	10,000	7000
මහනුවර	-	5000
ගම්පහ	20,000	10,000
කුරුණෑගල	15,000	10,000
පුත්තලම	5000	1000
කළුතර	20,000	5000
වව්නියාව	5000	5000
මන්නාරම	5000	1000
මුලතිව්	10,000	1000
කිළිනොච්චිය	20,000	6000
එකතුව	**170,500**	**88,000**

2.1.4.9 පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් සිදු කිරීම

පාසල් හා ප්‍රජා සහභාගිත්වයෙන්, මාර්ග දෙපස, ජලාධාර අවට හා ගං ඉවුරුවල, පාසැල් හා රාජ්‍ය ආයතන භූමිවල, ආගමික සිද්ධස්ථාන භූමිවල මෙන්ම වෙනත් ස්ථානවල රුක්රෝපණ වැඩසටහන් 484ක් ක්‍රියාත්මක කරන ලදි.

වගුව 2. 10: දීප ව්‍යාප්ත රුක් රෝපණ වැඩසටහන්

ක්‍රියාකාරකම	සංඛ්‍යාව
මාර්ග දෙපස රුක් රෝපණය	79
ජලාධාර අවට හා ගං ඉවුරුවල රුක් රෝපණය	46
පාසැල්වල රුක් රෝපණය	104
රජයේ ආයතන භූමිවල රුක් රෝපණය	112
ආගමික සිද්ධස්ථාන භූමිවල රුක් රෝපණය	72
නාගරික භූමිවල රුක් රෝපණය	7
වෙනත් ස්ථානවල රුක්රෝපණ	64
එකතුව	**484**





රූපය 2.6 : පාසල් , රාජ්‍ය , පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් ඇති කිරීම

2.1.5 වානිජ වන වගා ස්ථාපිත කිරීම (RCT)

2.1.5.1 වානිජ වන වගා ස්ථාපිත කිරීම (RCT)

පරිනතවූ වානිජ වන වගා හෙක්ටයාර් 754.45ක් හෙලීම් සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාර දී ඇත. (නුවරඑළිය, මොනරාගල, මහනුවර, බදුල්ල, මාතලේ, අනුරාධපුර, පොලොන්නරුව, ත්‍රීකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, මුලතිව්, වවුනියා, කළුතර, මාතර, රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල) ඉන් වන වගා හෙක්ටයාර් 631.31ක් 2023 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව විසින් හෙලීම් අවසන් කර නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර, එහි වන වගා ප්‍රතිස්ථාපනය සිදුකර අවසන් කර ඇත.

2.1.5.2 පැළ තවාන් ස්ථාපනය හා නඩත්තුව

නැවත වනවගා කිරීමේ වැඩසටහන සඳහා අවශ්‍ය බීජ පැල 1,217,200 ක් නිෂ්පාදනය කර, මාස 10 කට ආසන්න කාලයක් තවාන් තුළ නඩත්තු කිරීම සිදු කරනු ලබයි. මෙහි දී තවාන් තුළ තේක්ක, ඉයුකැලිප්ටස්, කායා, හල්මිල්ල හා දේශීය විශේෂ ස්ථාපනය කර ඇත.

2.1.5.3 නොමේරූ වනවගා නඩත්තු

රාජ්‍ය දැව සංස්ථාව විසින් පූර්ණ හෙලීම් සිදුකර නැවත වනවගා සිදු කරන ලද පසුගිය වසර 03ක නොමේරූ වනවගා හෙක්ටයාර් 4808.34ක නඩත්තු කටයුතු 2023 වර්ෂයේදී සිදුකර ඇත. එහි දී වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැලැක්වීම හා පාළු පැල සිටුවීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂයේදී ස්ථාපිත වන වගා නඩත්තුව වාර 02ක්ද, 2021 වර්ෂයේදී ස්ථාපිත වන වගා නඩත්තුව වාර 02ක්ද හා 2020 වර්ෂයේ ස්ථාපිත වන වගා වාර 01ක්ද නඩත්තු කරන කරන ලදී.

2.1.5.4 වන සංගණන හා ගස් ලැයිස්තු සකස් කිරීම

පූර්ණ හෙලීම් කිරීමට යෝජිත වනවගා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාරදීමට ප්‍රථමයෙන් වන සංගණන හා ගස් ලැයිස්තු සකස් කර ස්කන්ධ භාග ගණනය කිරීම සිදු කරනු ලබයි. මෙහි දී 2023 වර්ෂයේ වනවගා හෙක්ටයාර් 408.4ක් වන සංගණනය හා ගස් ලැයිස්තු සකස් කිරීම සිදුකර ඇත.

2.1.5.5 කඳු මුදුන් වන වගා නඩත්තුව සිදු කිරීම

ජල පෝෂක ලෙස වැදගත් වන භායනයට පත් කඳුමුදුන්හි ස්ථාපිත වන වගා අතරින් 2022 හා 2021 වර්ෂ වලදී මාතලේ හා බදුල්ල දිසාවල ස්ථාපිත වනවගා හෙක්ටයාර් 50ක් පසුගිය වර්ෂයේදී නඩත්තු කටයුතු සිදුකරන ලදී.

2.1.5.6 කැබිලිත්ත වන වගා ස්ථාපනය හා කැබිලිත්ත වන වගා නඩත්තු

2030 වන විට ශ්‍රී ලංකාවේ වන වැස්ම 32% දක්වා වැඩි කිරීමේ අරමුණින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත ආරක්ෂක අංශ වල සහාය ඇතුව හායනයටපත් වත්තේගම කැබිලිත්ත රක්ෂිතයේ හෙක්ටයාර් 1033ක් 2022 වසරේ දී ස්ථාපනය කර ඇත. එම ස්ථාපිත වන වගා හෙක්ටයාර් 1033ක ප්‍රමාණය 2023 වර්ෂයේදී පළමු වසර නඩත්තුව අවස්ථා 02 කදී සිදුකර ඇත.

එමෙන්ම, කැබිලිත්ත වනවගා ස්ථාපනයේ දෙවැනි අදියර වශයෙන් 2023 වර්ෂයේ දී වනවගා හෙක්ටයාර් 40ක් ස්ථාපනය කිරීම සිදුකරනු ලබයි.

2.1.5.7 වනාන්තර භූදර්ශන ප්‍රතිස්ථාපන කිරීමේ වැඩසටහන

රත්නපුර දිසාවේ වළංකන්ද, සිංහරාජ කොස්ගුලන කොටස, අරුක්ගොඩ, කිතුල්අතුර, රජවක රක්ෂිතය, ගුරුමඩේ මුකලාන, රත්කැරැව්විට, හතරබාගේ රජයේ වනය යන වනාන්තර මායිම් වටා කිලෝමීටර් 65ක ස්වභාවික වැටක් නිර්මාණය කරන ලදී.

2.1.5.8 පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම

පුද්ගලික අංශයේ සමාගම් 07ක (ඔරියන්ටල් රෙසින්ස්(පුද්) සමාගම, පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම සහ විලව් මෝබයිල් ආයතනය,J.C.T කෙමිකල්ස් (පුද්.සමාගම), K.D.V.කුමාර මහතා,ටී.අයි. ගුණසේකර මහතා, චානක සමරවීර මහතා සිය වානිජ මට්ටමේ රෙසින් නිස්සාරණය කටයුතු වලට අදාල ගිවිසුම් දීර්ඝ කරන ලද අතර එම වනවගා වල රෙසින් නිස්සාරණ කටයුතු 2023 වර්ෂය පුරා සිදු කරන ලදී. හෙක්.875.48 ක ඉඩම් ප්‍රමාණයක් රෙසින් නිස්සාරණ කටයුතු සඳහා පුද්ගලික අංශය වෙත බදු දී ඇති අතර 2023 ඉන් ලද ආදායම රුපියල් මිලියන 15.9කි.

වගුව 2. 11: පයිනස් වනවගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම

සංවිධානයේ නම	බදු දුන් ඉඩම් ප්‍රමාණය (හෙක්.)	බදු ආදායම (රුපියල්)
1. ඔරියන්ටල් රෙසින්ස් (පුද්) සමාගම	42.8	383,924.36
2. පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම	127.5	1,572,350.98
3. විලව් මෝබයිල්	74.5	1,293,044.70
4. J.C.T කෙමිකල්ස් (පුද්) සමාගම	363.7	6,182,900.00
5.K.D.V. කුමාර මයා	14.6	1752000.00
6.ටී. අයි. ගුණසේකර මයා	192.38	4,123,958.00
7.චානක සමරවීර මයා	60	600,000.00
එකතුව	**875.48**	**15,908,178.04**

2.1.5.9 2023 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2023 වර්ෂය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රුපියල් මිලියන 652.97කි. මෙයට පූර්ණ හෙලීම් මගින් ලබා ගන්නා දැවවල වටිනාකම වන රුපියල් මිලියන 583.05 ක් ද, පරිණත වන වගා කළමනාකරණය මගින් ලබා ගන්නා දැව වල වටිනාකම වන රුපියල් මිලියන 63.6ක් ද, වන අපරාධ වලින් අත්පත් කරගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් දැවවල වටිනාකම වන රුපියල් මිලියන 6.3ද ඇතුලත් වේ .

2.1.5.10 පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන 2023

පුද්ගලික අංශය සතු සම්පත් වන වගා සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණින් පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩසටහනේ අදියර දෙකක් වසර 2000 දී සහ 2002 දී දියත් කරන ලදී. 2019 වර්ෂයේ දී පුද්ගලික අංශය සමඟ ඇති කර ගත් ගිවිසුම් අනුව හෙක්.387.92ක වනවගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

වගුව 2. 12 : පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන 2023

දිස්ත්‍රික්කය	අඩවිය	ගිවිසුම් අංකය	විශේෂය	අදියර		ප්‍රමාණය (හෙක්.)
				I	II	
කුරුණෑගල	ගල්ගමුව	1070	තේක්ක	✓		17.80
	ගල්ගමුව	1108	තේක්ක	✓		11.142
	ගල්ගමුව	1091	තේක්ක	✓		6.244
අනුරාධපුරය	අනුරාධපුරය	2002/01	තේක්ක		✓	40.00
	අනුරාධපුරය	2002/09	තේක්ක		✓	83.00
	කැකිරාව	2002/07	තේක්ක		✓	35.00
	කැකිරාව	2002/05	තේක්ක		✓	4.00
	අනුරාධපුරය	2002/12	තේක්ක		✓	4.00
	අනුරාධපුරය	17	තේක්ක	✓		20.234
	කැකිරාව	177	තේක්ක	✓		4.00
පොළොන්නරුව	හබරණ	2002/26	මිශ්‍ර විශේෂ		✓	47.00
මාතලේ	නාඋල	1180	තේක්ක	✓		9.50
	නාඋල	1228	තේක්ක	✓		4.00
	නාඋල	2002/15	තේක්ක		✓	3.00
	නාඋල	2002/20	තේක්ක / කායා		✓	90.00
	නාඋල	2002/18	තේක්ක		✓	5.00
	නාඋල	2002/16	තේක්ක		✓	4.00
එකතුව				**07**	**10**	**387.92**

2.1.5.11 බීජ පැල නිෂ්පාදනය 2023

වගුව 2. 13 : බීජ පැල නිෂ්පාදනය 2023

දිස්ත්‍රික්කය	විශේෂය	බීජ පැල සංඛ්‍යාව
අනුරාධපුරය	තේක්ක/කායා	102,080
මඩකලපුව	තේක්ක/කායා	36,000
පොළොන්නරුව	හල්මිල්ල	1,49,600
මාතර	දේශීය මිශ්‍ර	5740
හම්බන්තොට	කායා	68,000
නුවරඑළිය	ඉයුකැලිප්ටස්	81,668
බදුල්ල	මිශ්‍ර වනවගා	2,84,910
මොණරාගල	තේක්ක/ඇත්දෙමට	1,12,470
කළුතර	හොර මිශ්‍ර	84,500
කුරුණෑගල	තේක්ක/කායා/මිශ්‍ර	2,24,000
මුලතිව්	තේක්ක	119,680
වවුනියාව	තේක්ක	60,000
ත්‍රිකුණාමලය	තේක්ක	51,000
එකතුව		**1,379,648**

2.1.5.12 සංචාරක බංගලා වලින් ලද ආදායම - 2023

වගුව 2. 14 : සංචාරක බංගලා වලින් ලද ආදායම 2023

අනු අංකය	සංචාරක බංගලාවේ නම	ආදායම (රු.)
1	අනුරාධපුර	64,992.00
2	නුවරඑළිය	109732.47
3	පට්ටිපොල	138,615.25
4	හාලිඇල	77,144.82
5	කුබල්පොල	54,613.48
6	තණමල්විල	77,722.11
7	මින්නේරිය	24,650.26
8	නාදුගල	19,748.38
9	තඹබෝව	19,001.97
10	ඔහිය	299,899.75
11	හම්බන්තොට	19,986.97
12	මහනුවර	88,678.38
13	කතරගම	79,953.66
14	හපුතලේ	433,845.63
15	කන්නෙලිය	391,920.00
16	දුම්බර වන නිවහන	1,733,866.47

17	කන්නෙලිය කා.අ4	2,645.00
18	ඩීන්ස්ටන් ස.ම	457,085.00
19	ත්‍රීකුණාමලය	244,547.50
20	කන්දෙඇල	465,307.18
21	තෙල්ගමුඔය	651,935.00
22	රඹුක්ඔළුව	90,849.50
23	නිදන ශාලාව	507,162.50
24	කැබින්1,2,3	661,537.50
25	සිංහරාජ මා.නි.	12,075.00
26	පිටදෙනිය	1,937,801.25
27	ගිංගග	324,012.50
28	හිරිකටුඔය	461,200.00
29	මෝනිංසයිට්	208,437.50
30	යාපනය	300,840.00
31	මින්නේරිය න.සං.	41,652.95
32	විහඟ කැදැල්ල	104,000.00
33	මන්නාරම	74,232.50
34	ඩීන්ස්ටන් ක.භූ.	72,450.00
35	මන්දාරම්නුවර ක.භූ	34,500.00
36	ඔහිය තො.ක.භූ	172,500.00
37	කොස්ගුලන වන නිවහන	277,495.00
38	රීක් සං.බං කුඩව	557,635.00
39	එක්ගල්ඔය	361,560.00
40	මඩකලපුව	125,363.25
එකතුව		**11,781,195.73**

2.1.5.13 2023 වර්ෂයේ දී සිදුකරන ලද අමතර ක්‍රියාකාරකම්

මීට අමතරව රාජ්‍ය දැව සංස්ථාවේ හෙලීම් ප්‍රමාදය මත පූර්ණ හෙලීම් ඉලක්කය අඩු වූ බැවින් එම ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනිමින් වන වගා වල අස්වැන්න ඉහල නැංවීමේ අරමුණින් අමතර ක්‍රියාකාරකම් වශයෙන් පහත වනවගා කළමනාකරණ කටයුතු සිදුකර ඇත.

ඒ අනුව මඩකළපුව,නුවරඑළිය, කුරුණෑගල, මොණරාගල දිසාවන්හි පූර්ව වානිජ තුනී කිරීම් හෙක්ටයාර් 105.87 ක් ද, නුවරඑළිය හා අම්පාර දිසාවල වානිජ තුනී කිරීම් හෙක්ටයාර් 193.23 ක් ද, බදුල්ල හා කුරුණෑගල දිසාවල වනවගා පවිත්‍ර කිරීම හෙක්ටයාර් 233.44 ක්ද හා නුවරඑළිය දිසාවේ පොහොර දැමීම හෙක්ටයාර් 152.82 ක් සිදුකර ඇත. ඊට අමතරව කුරුණෑගල, අනුරාධපුර, පොලොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමළය, නුවරඑළිය, මහනුවර, මාතලේ, මොනරාගල, බදුල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල 2024 වසරේ දී පූර්ණ හෙලීම් කිරීමට නියමිත වනවගා හෙක්ටයාර් 519.14 ක ගස් සලකුණු කිරීම සිදුකිරීම.

2.1.6 පරිසර සංචාරක කටයුතු

2.1.6.1 ස්වාභාවික මංපෙත් අභ්‍යන්තර සඟාරි ජීප්රථ මාර්ග සංවර්ධනය හා නඩත්තුව සිදු කිරීම

•ගල්ඔය, හුරුළු සහ ගල්විල යන පාරිසරික උද්‍යාන වල ඇති සඟාරි ජීප් රථ මාර්ග 64 kmක් සංවර්ධනය කර නඩත්තු කරන ලදී.

•සිංහරාජය, කොට්ටව, අඩාහැලෙන ඇල්ල, උඩවත්ත කැලේ, නකල්ස් ආශ්‍රිත නැරඹුම් මාවත් සහ 2.2 kmක ස්වභාවික මංපෙත් සංවර්ධනය කර නඩත්තු කර ඇත.



රූපය 2.7: ගල්ඔය පාරිසරික උද්‍යානය තුල පිහිටි අභ්‍යන්තර මාර්ග කි.මී. 6ක් සංවර්ධනය

.



රූපය 2. 8: ගල්ඔය පාරිසරික වන උද්‍යානය තුල පිහිටි ප්‍රධාන සහාරි ජීප් රථ මාර්ගයේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම



රූපය 2. 9: හුරුළු පාරිසරික වන උද්‍යානය තුල පිහිටි කි.මී.13.5ක් වූ සහාරි ජීප් රථ මාර්ගයේ බොරළු අතුරා තැලීම

2.1.6.2 පාරිසරික සංචාරක බංගලා සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.

•පාරිසරික සංචාරක ස්ථාන 15ක් (සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය -කුඩව/පිටදෙනිය, කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය, හිරිකටු ඔය, අඩාහැලෙන ඇල්ල, කුරුළු කැලය, මාකන්දාව, උඩවත්ත කැලේ, නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානය - ඩීන්ස්ටන්/මාතලේ, ඇල්ල රොක්, ඔහීය, ගල්ඔය පාරිසරික උද්‍යානය, හුරුළු පාරිසරික උද්‍යානය සහ ගල්විල පාරිසරික උද්‍යානය) නඩත්තු කර ඇත.

•සංචාරක නවාතැන් ස්ථාන 07ක් (කොස්ගුලන වන නිවහන, හිරිකටු ඔය කඳවුරු භූමිය, කන්නෙලිය නේවාසිකාගාරය, දෝතළුගල කඳවුරු භූමිය, මාතලේ වන නිවහන, ඔහීය කඳවුරු භූමිය, එක්ගල් ඔය කඳවුරු භූමිය) වැඩි දියුණු කිරීම් සමඟ නඩත්තු කරන ලදී.




රූපය 2.10 : ඇල්ල රොක් කඳවුරු භූමිය ඉදි කිරීම





රූපය 2.11 : එක්ගල් ඔය සංචාරක කඳවුර අලුත්වැඩියාව

2.1.6.3 විශේෂ සංවර්ධන කටයුතු (පාරිසරික සංචාරක) සිදුකිරීම.

- කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ ආරක්ෂිත පැති බැම්ම ඉදි කිරීම.
- කන්නෙලිය ආපන ශාලාව ඉදි කිරීම
- අඩාහැලෙන ඇල්ල නව ප්‍රවේශ පත්‍ර කවුළු ඉදි කිරීම.



රූපය 2.12 : අඩාහැලෙන ඇල්ල නව ප්‍රවේශ පත්‍ර කවුළු ඉදි කිරීම

2.1.6.4 නව සංචාරක ස්ථාන හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම.

•හඳුනාගත් ස්ථාන වල නව කඳවුරු භූමි 3 ක් ඉදි කර ඇත.

ඒ අනුව

කණ්ඩලම, ගල්විල සහ ඔහීය යන ස්ථාන වල නව කඳවුරු භූමි ස්ථාපිත කර ඇත.




රූපය 2.13 : කණ්ඩලම නව කඳවුරු භූමියක් ඉදි කිරීම

2.1.6.5 පාරිසරික සංචාරක මධ්‍යස්ථානවල ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම.

•වීඩියෝ පටිගත කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ලබා ගෙන ඇත.

2.1.6.6 පාරිසරික සංචාරක මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදු කිරීම

- පාරිසරික සංචාරක මධ්‍යස්ථාන 16ක් නඩත්තු කර ඇත.

i. සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය - පිටදෙනිය

ii. සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය - කුඩව

iii. නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානය - මාතලේ

iv. නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානය - නුවර

v. කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය - ගාල්ල

vi. කුරුළු කැලය - කෑගල්ල

vii. මාකන්දාව - කෑගල්ල

viii. ගල්ඔය පාරිසරික උද්‍යානය - පොලොන්නරුව

ix. හුරුළු පාරිසරික උද්‍යානය - පොලොන්නරුව

x. එක්ගල්ඔය - අම්පාර

xi. නුවරගල - අම්පාර

xii. ඇල්ල රොක් - බදුල්ල

xiii. ඔහීය - බදුල්ල

xiv. උඩවත්ත කැලේ - මහනුවර

xv. හිරිකටු ඔය - බලන්ගොඩ

xvi. අඩාහැලෙන ඇල්ල - ගාල්ල

2.1.6.7 පාරිසරික සංචාරක අංශයේ 2023 වසරේ ආදායම

වගුව 2.15 : පාරිසරික සංචාරක අංශයේ 2023 වසරේ ආදායම

ස්ථානය	සංචාරකයන් ප්‍රමාණය			සංචාරක අදායම			
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
මාකන්දාව	1,505	557	2,062	80,177.88	411,652.54	0	491830.42
කුරුළුකැලේ	1765	0	1765	94990.18	0	0	94990.18
නුවරගල (අම්පාර)	1156	10	1166	143374.72	7826.00	0	151200.72
එක්ගල්ඔය (අම්පාර)	205	0	205	133,200.00	0	0	133,200.00
කොට්ටව (ගාල්ල)	1185	186	1371	70481.69	101582.74	0	172064.43
කන්නෙලිය (ගාල්ල)	33409	2056	35465	2578005.35	1722260.88		4300266.23
අඩාහැලෙන ඇල්ල (ගාල්ල)	0	0	0	0	0	0	0
හුරුළු (පොලොන්නරුව)	43585	67618	111203	7337913.05	115617391.31		122955304.36
ගල්ඔය (පොලොන්නරුව)	654	2401	3055	67095.64	1866130.44		1933226.08
සිංහරාජ (පිටදෙනිය)	31595	8104	39699	3103922.96	8346266.84		11450189.80
සිංහරාජ (රත්නපුර))	13554	4132	17686	1695582.57	3674921.73		5370504.30
නකල්ස් (මහනුවර))	2215	715	2930	136518.81	552496.54		689015.35
නකල්ස් (මාතලේ)	116198	22077	138275	7010675.07	2494717.78		9505392.85
උඩවත්ත කැලේ	21781	3947	25728	1177126.45	3044352.33		4221478.78
රත්න ඇල්ල	5076	638	5714	303565.37	471842.98		775408.35
යහන්ගල	82	2	84	8556.70	1565.22		10121.92
ගැරඩ් ඇල්ල	278	1	279	29009.30	782.61		29791.91
පිදුරුතලාගල	15362	54	15416	857685.31	40695.20		898380.51
මන්දාරම්නුවර	14227	3	14230	847824.80	2347.80		850172.60
බඩගමුව	5752	1	5753	234956.49	521.73		235478.22
ගල්විල	153	9	162	15285.00	6885.00		22170.00
දොළකන්ද	2119	7	2126	133649.75	4590.00		138239.75
බදුල්ල (ඇල්ලගල)	8355	10953	19308	492140.70	7779054.42		8271195.12
කන්දේ ඇළ	371	0	371	13343.52	0		13343.52
එකතුව	**320,582**	**123,471**	**444,053**	**26,565,081.31**	**146,147,884.09**		**172,712,965.40**
රූපගතකිරීම් වලින් ලද ආදායම							**6,005,336.50**
වාහන							**20,411,000.65**
මුළු ආදායම (පාරිසරික සංචාරක අංශය)							**199,129,302.55**

2.1.7 පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු අංශය

2023 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වල ගුණාත්මකභාවය වර්ධනය පිණිස ධාරිතා සංවර්ධන සඳහා 2023 වර්ෂයේ වාර්ෂික සැලසුම සකස් කර තිබුනද 1/2023 අයවැය චක්‍රලේකය අනුව බඳවාගැනීම් හා උසස්කිරීම් සඳහා අත්‍යවශ්‍ය පුහුණු පමණක් සිදුකිරිමට උපදෙස් ලබාදී තිබුනු බැවින් සැලසුම්කරන ලද පුහුණු සිදුකිරීමට නොහැකි විය. කෙසේ වුවද නවක පත්වීම් ලද වන ක්ෂේත්‍ර සහකාරවරුන් 100ක් සඳහා දින 5ක පුහුණුව ලබාදීම සිදුකරන ලදී. කාර්යක්ෂමතා කඩඉම් සඳහා රාජ්‍ය භාෂා දෙමළ පාඨමාලාවට නිලධාරීන් යොමුකරන ලදී (පැය 150 පාඨමාලා 2). මාර්ගගතව සිදුකල විදෙස් පුහුණු පාඨමාලා 5ක් සඳහා නිලධාරීන් 87 ක් යොමුකළ අතර, විදෙස් පුහුණු පාඨාමාලා හා සම්මන්ත්‍රණ 16ක් සඳහා නිලධාරීන් 34ක් සහභාගී විය. මෙයට අමතරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අත්‍යවශ්‍ය කෙටිකාලීන පුහුණු සඳහා අදාල අංශ වල ඉල්ලීම් අනුව නිලධාරීන් යොමුකරන ලදී.

Sri Lanka Forester විද්‍යාත්මක සඟරාවේ 41 කලාපය පිටපත් 50ක් මුද්‍රණය කරන ලද අතර Sri Lanka Forester විද්‍යාත්මක සඟරාවේ 42 කලාපය ප්‍රකාශයට පත්කිරිමට අවශය කටයුතු සිදුකරන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එදිනෙදා රාජකාරී සඳහා අවශ්‍ය ලිපි ලේඛන/වාර්තා වලට අදාලව භාෂා පරිවර්තන කටයුතු 63 ක් පමණ අවසන් කර ඇත.

2.1.8 වන විද්‍යා පර්යේෂණ ආයතනය

2023 වර්ෂයේදී නව පර්යේෂණ අත්හදා බැලීම් සහ තවාන් පර්යේෂණ ස්ථාපනය කිරීම, දැනට ස්ථාපනය කර තිබෙන පර්යේෂණ අත්හදාබැලීම් නඩත්තු කිරීම, ක්ෂුද්‍ර ප්‍රචාරණ කටයුතු අඛණ්ඩව කිරීම , බීජ ප්‍රභව සංවර්ධනය කිරීම සහ බීජ රැස් කිරීම ඇතුළු සිව් ආකාරයක ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

මෙයට අමතරව අවශ්‍ය පරිදි ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සහ දත්ත රැස් කිරීමේ කටයුතුද සිදුකරන ලදී. ක්ෂේත්‍ර පරීක්ෂණ සහ ඒ ඇසුරින් ලබාගන්නා නිරීක්ෂන පදනම් කරගනිමින් පර්යේෂණ ලිපි 06ක් ප්‍රකාශයට පත් තරන ලදී.

හෙක්ටයාර 49.6ක භූමි ප්‍රමාණයක් විවිධ ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සඳහා යොදාගන්නා ලදී. (ඇතැම් අත්හදා බැලීම් සහා ක්ෂේත්‍ර මෙහෙයුම් එකකට වඩා වැඩි සංඛ්‍යාවක් පැවති අතර එක් වරකට වැඩි සංඛ්‍යාවක් නඩත්තු කරන ලදී.)

කෙසේ වුවද , අත්හදා බැලීම් අසාර්ථක වීම හේතුවෙන් (නියග, ගින්නෙන් සිදුවූ හානි සහ වන සතුන්ගෙන් සිදුවන හානි හේතුකොටගෙන) සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් (අයවැය මගින් වියදම් සීමා කිරීම /භාණ්ඩ සහ සේවා වල මිල ගණන් ඉහළ යාම හේතු කොට ගෙන) සැලසුම් කල ඇතැම් ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි විය.

වගුව 2.16: වන විද්‍යා පර්යේෂණ

ප්‍රධාන සංරචකය	2023 වාර්ෂික ඉලක්කය		මූල්‍ය ප්‍රගතිය	
	භෞතික	මූල්‍ය (රු.මී)	මූල්‍ය (රු.මී)	මූල්‍ය ප්‍රතිශතය %
පවත්නා පර්යේෂණ නඩත්තු කිරීම	පර්යේෂණ 09 සහ වෙනත්	0.46	0.453	98
නව අත්හදා බැලීම් පර්යේෂණ ස්ථාපනය හා සංවර්ධනය	පර්යේෂණ 03	0.415	0.367	88
තවාන් හා විද්‍යාගාර පර්යේෂණ සිදු කිරීම	01 ක් සහ වෙනත් අවශ්‍ය පරිදි	0.087	0.086	98
පර්යේෂණ පත්‍රිකා සැකසීම/Newsletter	6	0.07	0.066	94

බීජ උද්‍යාන කළමනාකරණය	01	0.066	0.061	92
බීජ එකතු කිරීම	බීජ එකතුකිරීම-කි.ග්‍රෑ 300	0.195	0.1	51
කුඹල්පොල සහ බදුල්ල පර්යේෂණ ඒකක පවත්වාගෙන යාම	පර්යේෂණ ඒකක - 2	1.707	1.837	100
එකතුව			**2.97**	**99**

2.1.8.1 පවත්නා පර්යේෂණ නඩත්තු කිරීම

1.1 කුරුණෑගල පර්යේෂණ මධ්‍යස්ථානය

2023 වර්ෂය තුලදී පර්යේෂණ 14ක (හෙක් 42.2ක්) නඩත්තු කටයුතු සිදුකරන ලදී. යෝජිත නඩත්තු කිරීම්වල ට අමතරව පොහොර යෙදීම (හෙක් 06) සහ පාළු සිටුවීම (හෙක් 0.9) යන ක්‍රියාකාරම්ද ඇතැම් පර්යේෂණ ආශ්‍රිතව සිදුකරන ලදී. සෙවන සැපයීම සඳහා ලියන් බීජ පැල සිටුවන ලදී. තවද ,විහාරකන්ද හා හතරලියද්ද පිහිටි පර්යේෂණ සඳහා සෙවණ සැපයීම සඳහා *Gliricidia sepium* අතු සිටුවන ලදි.

බීජ ප්‍රභව නඩත්තු කිරීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බරිගොඩ සහ ඇත්ගාල යන ස්ථාන වල ස්ථාපනය කරන ලද බීජ ප්‍රභව (බීජ උද්‍යාන) හෙක්ටයාර 26 ක නඩත්තු කටයුතු සිදු කරන ලදී.

1.2 බදුල්ල පර්යේෂණ මධ්‍යස්ථානය

අදාල වර්ෂය තුල පර්යේෂණ අත්හදාබැලීම් හතරක නඩත්තු කටයුතු සිදු කරන ලද අතර ගස්කැපීම (හෙක් 6.8) , ඇල්ලි ශුද්ධ කිරීම සහ පොහොර යෙදීම (හෙක් 0.6) යන ක්‍රියාකාරකම්ද සිදුකරන ලදී.

2.1.8.2 නව අත්හදා බැලීම්, පර්යේෂණ ස්ථාපනය හා සංවර්ධනය කිරීම

2.1 ක්ෂේත්‍ර පරීක්ෂණ

i.*Melia dubia* යන ශාක විශේෂයේ ක්ලෝනීය ප්‍රචාරණ ශිල්ප ක්‍රම ඇගයීම

ලුණුමිදෙල්ල *(Melia dubia)* යනු දකුණු ආසියානු රටවල හමුවන කෘෂි වන වගා ශාක විශේෂයකි. පොත්පත් ආශ්‍රිත තොරතුරු වලට අනුව , වර්ධක ප්‍රචාරණයෙන් ව්‍යාප්ත වන , සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන , මධ්‍යම ප්‍රමාණයේ ගුණාත්මක බවකින් යුක්ත සාර්ථක විභවයක් සහිත ශාකයකි.

ශ්‍රී ලංකාවේ සිදුකරන ලද අධ්‍යන කිහිපයකින්ම *Melia dubia* ශාකය අතු කපා සිටුවීම මඟින් විශාල වශයෙන් ප්‍රචාරණය කර ගත හැකි බව සොයාගෙන තිබේ.

පෙර සිදු කරන ලද පර්යේෂණ වලින් ලද තොරතුරු වලට අනුව , ක්ලෝනීය *Melia dubia* පර්යේෂණ බිම් කොටසක් ස්ථාපනය කිරීමට ඇති හැකියාව ඇගයීම සඳහා පොල්ගොල්ල පැල තවානේදී මූලික පර්යේෂණ කටයුතු සිදු කර තිබේ.

ii.පටක රෝපණයෙන් ලබාගත් තේක්ක ක්ලෝන සහ බීජ උද්‍යාන වල වූ වර්ධනය වූ තේක්ක බීජ පැල පිළිබඳව සිදුකරනු ලබන සන්සන්දනාත්මක අධ්‍යයනය.

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ පටක රෝපණය මගින් සහ සම්ප්‍රදායික ප්‍රචාරණය මඟින් ලබාගත් තේක්ක ක්ලෝන වල සහ බීජ පැල වර්ධනය ඇගයීමයි. මෙම පර්යේෂණය කුරුණෑගල ඇත්ගල ප්‍රදේශයේ ස්ථානගතව තිබේ. මෙය පටක රෝපනයෙන් ලබාගත් තේක්ක ක්ලෝන වල ට එදිරිව තේක්ක බීජ පැල වල වර්ධනය පිළිබඳව පුළුල් සන්සන්දනාත්මක අධ්‍යනයක් සඳහා ආරම්භක පියවරක් ලෙස සැලකිය හැකිය. මෙම පරීක්ෂණ පුළුල්ව සිදුකිරීමේදී තවත් ස්ථාන කිහිපයකට ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.

2.1.8.3 තවාන් හා විද්‍යාගාර පර්යේෂණ සිදු කිරීම

i . තේක්ක සහ වල්ලපට්ට ශාක විශේෂ ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම

වල්ලපට්ට (*Gyrinops walla)* සහ *(Tectona grandis)* තේක්ක පිළිබඳ පටක රෝපණය පරීක්ෂණ තවදුරටත් අඛණ්ඩව සිදුකරන ලදි. මෙයට විවිධ රෝපණ මාධ්‍ය සකස් කිරීම සහ පරීක්ෂා කිරීම මෙන්ම උප රෝපිත සැකසිම සහ විවිධ දේශගුණ තත්වයන්ට හුරුකිරීම ඇතුලත් වේ.

අ. තේක්ක

තේක්ක පටක රෝපිත පැළ හා ආශ්‍රිත ප්‍රධානතම ගැටලුවක් වන්නේ ඒවා ප්‍රාණවත් බවින් අඩු වීමයි.

එමෙන්ම එම පැළ පරිසරයට අනුගත වීමේ ක්‍රියාවලියේදී ඉහළ මරණ අනුපාතයක් පෙන්වීම ද ගැටලුවකි.මෙම පැලවල ප්‍රාණවත් බව ඉහල නැංවීම දෙයාකාරයට සිදුකරගත හැකිය.ගුණන අවධියේදී භාවිතා කරන පටක රෝපණ මාධ්‍යයේ pH අගය වෙනස් කිරීමෙන් සහ පටකරෝපණ මාධ්‍යයේ සුක්‍රෝස් සාන්ද්‍රණය ඉහළ නැංවීමෙන් ද තේක්ක පැලවල ප්‍රාණවත් බව ඉහළ නැංවිය හැකිය.

ආ.වල්ලපට්ට

විවිධ ස්ථානවලින් රැස් කරන ලද බීජ වල ප්‍රරෝහණය සිදුවන ආකාරය පිළිබඳව පරීක්ෂණ සිදු කරන ලදි. මෙහිදී මුහුණ පෑ ප්‍රධානතම ගැටලුව වන්නේ පාරිසරික තත්ත්වයන්ට අනුගත වීමේදී පෙන්නුම් කරන ඉහළ මරණ අනුපාතිකයයි

ඇ.පරිසරයට අනුගත වීම සඳහා පිළියම්

ක්ෂුද්‍ර ප්‍රචාරකයක් සැකසීමේ කටයුතු අවසන් කර තිබේ. විවිධ ශාක විශේෂ වල විශාල ප්‍රමාණයේ අතු වර්ධක ප්‍රචාරණයේදී සහ පටක රෝපණයෙන් ලබාගත් ක්ලෝන ප්‍රචාරණයේ දී සහ පටක රෝපණයෙන් ලබාගත් ක්ලෝන පරිසරයට අනුගත කිරීමේ ක්‍රියාවලියේදී මීදුම්කාරක සහ ස්වයංක්‍රීය ජල මුහුර්තක යොදා ගනිමින් ඉහළ ආර්ද්‍රතාවය ක් පවත්වා ගැනීම ඔස්සේ ඉහළ නොනැසී පැවතීමේ අනුපාතයක් අත්පත් කර ගැනීමට හැකි විය. විවිධ විශේෂ *(Melia dubia, Tectona grandis, Gyrinops walla)* සඳහා ප්‍රරෝහණ අධ්‍යයනයන් සිදු කරන ලදී.

ii. තෝරාගත් වන ශාක විශේෂ කිහිපයක බීජපැල වර්ධනය කෙරෙහි ජෛව පටල පොහොර වල බලපෑම ඇගයීම

වනාන්තර වල හමුවන තොරාගත් ශාක විශේෂ කිහිපයක බීජ පැල වර්ධනය කෙරෙහි ජෛව පටල පොහොර යෙදීමෙන් සිදුවන බලපෑම ඇගයීම සඳහා නිර්මාණය කරන ලද මෙම පර්යේෂණය 2022 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2023 වර්ෂයේදී ද අඛණ්ඩව සිදුකරන ලදී. මෙම පර්යේෂණය සඳහා බුරුත (*Chloroxylon swietenia),*තේක්ක (*Tectona grandis*) , හල්මිල්ල *(Berrya cordifolia)* සුදු හඳුන් *(Santalum album, Eu.tereticornis)* බීජ පැල භාවිතා කරන ලදී. එක් එක් ශාක විශේෂ සඳහා ප්‍රතිඵල පහත දැක්වේ.

•හල්මිල්ල

ඇසට පෙනෙන නිරීක්ෂණවලට අනුව ජෛව පටල පොහොර යෙදූ බීජ පැලවල වර්ධනය පාලක බීජ පැලවල වර්ධනයට වඩා ඉහළ මට්ටමක පැවතිණි. බීජ පැල වල උස පිළිබඳ දත්ත රැස් කරන ලදී.

•තේක්ක

ඇසට පෙනෙන අන්දමට ජෛව පටල පොහොර යෙදූ බීජ පැලවල සහ පාලක බීජ පැලවල වර්ධනය අතර වෙනසක් දක්නට නොලැබිණි. බීජ පැල වල උස පිළිබඳව ද දත්ත රැස් කරන ලදී.

•සුදු හඳුන්

පොලිතින් මළුවල වර්ධනය වන සුදු හඳුන් බීජ පැළ වලට වඩා එම මලු තුළ අඩංගු ආධාරක ශාකයේ *(Alternanthera bettzickiana*) සීඝ්‍ර වර්ධනයක් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව ආධාරක ශාකයක් සහිතව

සහ රහිතව මෙම පර්යේෂණය නැවත සැලසුම් කරන ලදී. පාලකය සහ පාලිතය අතර ඇසට පෙනෙන අන්දමට කිසිදු වෙනසක් දක්නට නොලැබිණි.

•*Eu.tereticornis*

කුඹල්පොළ පැල තවාන තුළ *Eu.tereticornis* බීජ පැළ සාර්ථක වර්ධනය නොවන බැවින් (ප්‍රරෝහණය වන බීජ පැලවල නොනැසී පවතින ප්‍රතිශතය පහළ අගයක් ගන්නා බැවින්) මෙම ජෛව පටල පර්යේෂණය සිදු කිරීමට නොහැකි විය.

iii. ප්‍රරෝහණ අධ්‍යයනයන්

අ. ජෑම්

Muntingia calabura යනු සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අඩි 25-40 ත් අතරින් උසකට වර්ධනය වන බොහෝ දුරට තිරස් දිශාවට අතු විහිදෙන ශාක විශේෂයකි. ගිනිකොණ දිග ආසියාවේ සුලභව දක්නට ලැබෙන මාර්ග දෙපස වැවෙන ශාක විශේෂයකි.

2018 වර්ෂයේ සිට වන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය විසින් හා භායනයට පත්වූ වනාන්තර ප්‍රතිස්ථාපනයට සහ ආක්‍රමශීලී ශාක විශේෂයක් වන ගිණි තෘණ විශේෂය පාලනය කිරීමට *Muntingia calabura* ශාක විශේෂය කෙතරම් යෝග්‍යදැයි කියා ඇගයීම සඳහා පර්යේෂණය සිදුකරයි. පෙර සිදු කරන ලද අධ්‍යයනයන්ගෙන් ලද ධනාත්මක ප්‍රතිඵල හේතු කොටගෙන 2021/2022 වර්ෂයේදී *Muntingia calabura* බීජ ප්‍රරෝහණය පිළිබඳව අධ්‍යනයක් සිදුකර අතර එමගින් තවාන් අවධියේදී බීජ පැලවල වර්ධනය වේගය ඇගැයීමට ලක් කරන ලදී. අරමුණු වලට අනුව වර්ෂය පුරාවටම දත්ත රැස් කරන ලද අතර පර්යේෂණ ලිපියක්ද ප්‍රකාශයට පත්කරන ලදි.

ආ. අරලු ,කැටකැල සහ බෝමී

වනාන්තරකරණ සහ නැවත වනවාගා කිරීම් වැඩසටහන් වලදී භාවිතා වන වටිනා ද්‍රව්‍යයකි බීජ. බීජ ප්‍රරෝහණ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමට වන නිලධාරීන්ගෙන් සහ විද්‍යාඥයන්ගේ ඇති කැමැත්ත දිනෙන් දින ඉහළ යමින් පවතී. කෘෂිකාර්මික බෝගවල බීජ මෙන් නොව වනාන්තරවල තිබෙන ගස්වල බීජ වල සුලභතාව සීමා සහිත වන අතර ප්‍රරෝහණ වේගයද පහළ මට්ටමක පවතී.

ඒ අනුව හැකි ඉහළම ප්‍රරෝහණ වේගයක් අත්පත් කර ගැනීම වනාන්තර ආශ්‍රිත පර්යේෂණ කටයුතු වලදී ඉතාම වැදගත් වේ. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කුඹල්පොළ සහ බදුල්ලේ පිහිටි පර්යේෂණ වධ්‍යස්ථානවල උපරිම බීජ බල සංඛ්‍යාවක් නිපදවීමේ අරමුණින් බීජ ප්‍රරෝහණ පර්යේෂණ සිදුකරනු ලැබේ. ක්ෂේත්‍ර නිරීක්ෂණවලට අනුව අරලු කැටකැල බීජ වල ප්‍රරෝහණ ප්‍රතිශතය පහළ මට්ටමක පැවතිනි.

තවද හඳුන්කූරු නිෂ්පාදනය ඇතුළු ප්‍රයෝජන රැසක් සඳහා යොදාගත හැකි හෝමී ශාකයේ බීජවල ප්‍රරෝහණය සම්බන්ධව තොරතුරු අල්පය. අරලු ,කැට කැල ,තේක්ක ,ගම්මාලු ,පලු ,කැන්ද ,සහ බෝමී

යන ශාක විශේෂ වල ප්‍රරෝහණ ප්‍රතිශතය නැංවීම සඳහා යොදාගත හැකි තාක්ෂණික ක්‍රම හඳුනාගැනීම සඳහා ප්‍රරෝහණ අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. අරලූ සහ කැටකැල යන ශාක විශේෂ දෙකෙහිම බීජ මාස දෙකක් තුළ ප්‍රරෝහණය නොවීය. කෙසේ වුවද බෝමී බීජ මාස දෙකකට පසුව ප්‍රරෝහණය විය. මෙම අධ්‍යනය තවදුරටත් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ඇ. ගැඩුඹ, තෙඛු සහ ගම්මාලු යන ශාක විශේෂ වල බීජ ප්‍රරෝහණය සඳහා යොදාගත හැකි ගැලපෙන ක්‍රමවේදයන් හඳුනාගැනීමට ප්‍රරෝහණය පිළිබඳ අධ්‍යයනයන් සිදුකරනු ලැබේ

iv.සාමාන්‍ය බීජ පරීක්ෂණය

2023 වර්ෂයේදී රැස්කළ බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය ඇගයීම සඳහා කායා, තේක්ක, අරලු, පලු සහ කැන්ද යන ශාක විශේෂ වල බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය ඇගයීමට පරීක්ෂණ සිදු කරන ලදී. නැවුම් කායා බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය 80-90%ක් අතරද නැවුම් තේක්ක බීජ වල ප්‍රතිශතය හා 4.75% ක්ද අරලු බීජ වල ප්‍රතිශතය 0.1%ද පලු බීජ වල ප්‍රතිශතය 65-75% අතරද කැන්ද බීජ වල ප්‍රතිශතය 50-60% අතරද පවතින බව නිරීක්ෂණය විය.

2.1.8.4 පර්යේෂණ පත්‍රිකා සැකසීම

පර්යේෂණ අත්හදා බැලීම් දහයක ශාක උස සහ පපු මට්ටමේදී විෂ්කම්භය ගණනය කර දත්ත රැස් කරන ලදී. වර්ෂය පුරාම දත්ත රැස්කර සිව්වන කාර්තුවේදී එම කටයුත්ත සම්පූර්ණ කරන ලදී දත්ත විශ්ලේෂණ ය කරන ලද අතර ප්‍රතිඵල යොදා ගනිමින් වාර්තා පිළියෙල කිරීමෙ කටයුතු කරගෙනයයි.

•Spacing and thinning requirement of Khaya senagalensis for higher timber production- W.D.P.Gomes

•Preparation of two parameter volume table for Khaya senagalensis in Sri Lanka- W.D.P.Gomes

•Impact of Biofilm biofertilizer on the growth of seedlings of selected plant species the nursery – A.L.M. Zuhry,G.Senaviratne,A.M.Razmy,Y.C.Indika.

•Studies on Seed germination and early growth evaluation of Muntigia calabura-an early fast growing potential tree for forest restoration- A.L.M. Zuhry, A.M.Razmy,E.M.B.P.Ekanayake

•Success in Grafting of red sandalwood (Pterocarpus santalinus) on gammalu (Pterocarpus marsupium) is breakthrough- A.L.M. Zuhry, A.M.Razmy

•Newsletter article -2022

2.1.8.5 බීජ ප්‍රභව කළමනාකරණයක් සිදු කිරීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බරිගොඩ සහ ඇත්ගල ස්ථාපනය කර තිබෙන බීජ ප්‍රභව උද්‍යානය හෙක්ටයාර 26ක් නඩත්තු කරන ලදී.

2.1.8.6 බීජ එකතු කිරීම

බරිගොඩ ස්ථාපනය කර තිබෙන බීජ උද්‍යානයෙන් තේක්ක බීජ කිලෝ ග්‍රෑම් 100ක් සහ බදුල්ල දිස්ත්‍රික්කය වැලිමඩ අඩවියෙන් *Eucalyptus grandis* බීජ කිලෝ ග්‍රෑම් 8.5ක් ද එක්රැස් කරන ලදී කායා බීජ කිලෝ ග්‍රෑම් 14.6ක් දැනටමත් රුක් රෝපණ වැඩසටහන් වලට ලබා දී තිබෙන අතර තේක්ක සහ යූකැලිප්ටස් බීජද දුක් රෝපණ වැඩසටහන් සඳහා ලබාදීමට නියමිතය. මෙයට අමතරව ගම්මාලු බීජ කිලෝ ග්‍රෑම් 3.5ක්ප්‍රරෝහණ පරීක්ෂණ සඳහා බීජ රැස කිරීමේ වැඩසටහන්වලදී එක් රැස් කරන ලදී. *Diospyros ebenum* බීජ පැළ 500ක් පැළ තවාන් තුළ නිපදවන ලදී.

2.1.8.7 කුඹල්පොල හා බදුල්ල පර්යේෂණ ඒකක පවත්වාගෙන යාම

කුඹල්පොළ සහ බදුල්ල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන දෙක නඩත්තු කරන ලදී. සනීපාරක්ෂක කටයුතු, ආරක්ෂණ කටයුතු, උපකරණ මිලදී ගැනීම මෙන්ම වෙනත් අවශ්‍ය කරන අළුත්වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු අවශ්‍යතාවය අනුව සිදුකරන ලදී. අමතරව විශ්ව විද්‍යාල සිසුන් සහ පාසල් සිසුන් ඉලක්ක කර ගෙන පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

2.1.9 වන විද්‍යා අධ්‍යාපනය සහ පුහුණු

වගුව 2.17: වන විද්‍යා අධ්‍යාපනය හා පුහුණු

ප්‍රධාන සංරචකය	2023 වාර්ෂික ඉලක්කය		මූල්‍ය ප්‍රගතිය	
	භෞතික	මූල්‍ය (රු.මි)	මූල්‍ය (රු.මි)	මූල්‍ය ප්‍රතිශතය %
NVQ 05 පාඨමාලා පැවැත්වීම	1. දේශන20- 2. ප්‍රායෝගික පරීක්ෂණ 15 - 3. පළමු හා දෙවන අධ්‍යනවාර විභාග පැවැත්වීම 4. වෙනත් කෙටිපුහුණු පැවැත්වීම	8.0	7.991	100%
අධ්‍යාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.(නුවරඑළිය/ඉනාමළුව) මධ්‍යස්ථාන - 02				

2.1.9.1 NVQ පාඨමාලා පැවැත්වීම

NVQ 5 (2023) ඩිප්ලෝමා පාඨමාලාව බීට්ටු වන නිලධාරීන් 28 හා වන ව්‍යාප්ති නිලධාරීන් 23ක් සඳහා පවත්වන ලදී. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කිරීමට හා ඉන්පසුව වාචික පරීක්ෂණය පැවැත්වීමට නියමිතව ඇත. NVQ 6 (2021/2022) පාඨමාලාවේ අවසන් පර්යේෂණ වාර්තාව හා ඉදිරිපත්කිරීම අවසන් කර ඇත. පළමු හා දෙවන අධ්‍යන වාර ප්‍රතිඵල නිකුත් කර ඇත.තෙවන හා සිව්වන අධ්‍යන වාර ප්‍රතිඵල නිකුත් කිරීමට ඇත.NVQ 05 2022 පළමු අධ්‍යයන වාර ලිඛිත පර්යේෂණ ප්‍රතිඵල නිකුත් කර ඇත. දෙවන අධ්‍යයන වාරයේ වාචික පර්යේෂණ පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට ඇත.

2.1.9.2අධ්‍යාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම

අධ්‍යාපන මධ්‍යස්ථාන නිසි පරිදි පවත්වා ගෙන යන ලදී (සඳතැන්න- නුවරඑළිය හා ඉනාමළුව) .

2.1.9.3 සේවා පුහුණු වැඩසටහන් සිදු කිරීම

වගුව 2.18 : සේවා පුහුණු වැඩසටහන්

ප්‍රධාන සංරචකය	2023 වාර්ෂික ඉලක්කය		මූල්‍ය ප්‍රගතිය	
	භෞතික	මූල්‍ය (රු.මි)	මූල්‍ය (රු.මි)	මූල්‍ය ප්‍රතිශතය %
1. 2023නවක වන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු පැවැත්වීම	නිලධාරී පුහුණු වැඩසටහන් 7ක් දෙපාර්තමේන්තු නිලධාරීන් 455කු සඳහා (දින 01 වැඩසටහන් 6ක් නිලධාරීන් 420ක්හා දින 2 වැඩසටහන් 1ක් නිලධාරීන් 35 ක්) සැලසුම් කර තිබිනි. 1/2023 අයවැය චක්‍රලේකය අනුව අත්‍යාවශ්‍යය පුහුණු පමණක් පවත්වන ලෙස දැනුම් දී ඇති නිසා සැලසුම් කරගත් පුහුණු පැවත්වීමට නොහැකි වූ අතර බදවාගැනීම් හා උසස් වීම් වලට අදාල අත්‍යවශ්‍ය පුහුණු සඳහා ප්‍රතිපාදන යොදවා ගන්නාලදී.		1.213650	100%
2. ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ QGIS පුහුණුවක් පැවැත්වීම			0.055	100%
3. රාජ්‍ය භාෂා දෙමළ පාඨමාලාව පැවැත්වීම) පැය 150 පාඨමාලා(2			0.225	100%
4. මාතර දිසාවන නිලධාරී කාර්යාලය වෙත SMART කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුවක් ලබාදීම			0.05	100%
5. Sri Lanka forester vol41 පිටපත්50 ක් මුද්‍රණය කිරීම			0.1325	100%
6. තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය සදහා පුහුණුව			0.019	100%
7. වෙනත් පුහුණු/ වියදම්			0.285879	100%

2.1.9 සම්පත් කළමනාකරණය

2023 වසරේ දී, කාර්යාල, නිල නිවාස, පර්යේෂණ මධ්‍යස්ථාන, සංචාරක බංගලා හා තවාන් ගොඩනැගිලි 32ක් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වැඩිදියුණු කර ඇත. එමෙන් ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන වාහන යන්ත්‍රෝපකරණ හා උපකරණ අවශ්‍යතාවය අනුව නඩත්තු කර ඇති අතර, දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, උපකරණ හා යන්ත්‍ර අවශ්‍යතාවය අනුව මිලදී ගෙන ඇත.

2.2 2023 වසරේ ක්‍රියාත්මක විශේෂ වැඩසටහන් (වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන)

2.2.1 මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ මාර්ග දෙපස රුක් රෝපණ කිලෝමීටර් 40.75ක් සිදු කර ඇත.

වගුව 2. 16 : මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන්

දිසාව	ප්‍රමාණය (km)
රත්නපුර	21.5
මාතර	1.5
අම්පාර	1.0
මොණරාගල	1.0
බදුල්ල	2.0
මාතලේ	2.8
ගම්පහ	0.75
කළුතර	3.2
කුරුණෑගල	2.0
පුත්තලම	2.0
කිලිනොච්චි	3.0
එකතුව	**40.75**

2.2.2 නාගරික තුරු ගොමු ස්ථාපනය

- වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ බදුල්ල, නුවරඑළිය, කළුතර, කුරුණෑගල, කෑගල්ල,මාතර, රත්නපුර යන දිසාවන්හී නාගරික තුරුගොමු 20ක් ස්ථාපනයට කටයුතු කරන ලදී.

2.2.3 කෘෂි වන වගා ස්ථාපනය

- කෘෂි වන වගා හෙක්ටයාර් 423.55ක් ස්ථාපනය සිදු කරන ලද අතර ඒ සඳහා ගොවීන් 1070ක් සහභාගී කරගනු ලැබිය

වගුව 2. 20 : වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ නව ගොවි වන වගා ස්ථාපනය

දිසාව	ස්ථාපිත ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.)	නිපදවූ පැළ සංඛ්‍යාව	සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව
රත්නපුර	15.00	15,000	54
අනුරාධපුර	130.60	143,300	373
පොළොන්නරුව	60.00	465,000	119
මඩකලපුව	5.00	5000	10
මොණරාගල	28.00	57,500	41
බදුල්ල	36.75	36,750	120
මාතලේ	46.20	39,000	161
මහනුවර	4.00	3000	17
පුත්තලම	10.00	11,000	30
කුරුණෑගල	20.00	20,500	69
වවුනියාව	28.00	28,000	36
මුලතිවු	40.00	20,000	40
එකතුව	**423.55**	**844,050**	**1070**



රූපය 2.14 : කෘෂි වන වගා ස්ථාපනය

2.2.4 කෘෂි වන වගා සඳහා පැළ නිෂ්පාදනය

විශේෂ වන වගා ව්‍යාපෘතිය යටතේ වන ව්‍යාප්ති කටයුතු සඳහා තේක්ක මුල් 100,000ක් නිපදවන ලදි.

වගුව 2. 21 : වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ තේක්ක මුල් නිපදවීම

දිසාව	පැල ප්‍රමාණය
රත්නපුර	10,000
හම්බන්තොට	5000
අනුරාධපුර	10,000
පොළොන්නරුව	5000
අම්පාර	5000
ත්‍රිකුණාමලය	5000
මඩකලපුව	5000
මොණරාගල	5000
බදුල්ල	4000
මාතලේ	12,000
කුරුණෑගල	10,000
පුත්තලම	4000
වව්නියාව	5000
මන්නාරම	5000
මුලතිව්	5000
කිළිනොච්චිය	5000
එකතුව	**100,000**

2.2.5 ගෙවතු සංවර්ධනය

- වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ 2023 වර්ෂය තුල ගෙවතු 4641ක් සඳහා සුදුසු පැළ සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදී.

වගුව 2. 22 : වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ ගෙවතු සංවර්ධනය කිරීම

දිසාව	විශේෂ වන වගා ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද ගෙවතු
රත්නපුර	1791
කෑගල්ල	150
ගාල්ල	150
මාතර	150
හම්බන්තොට	150
අනුරාධපුර	150
පොළොන්නරුව	150
අම්පාර	125
ත්‍රිකුණාමලය	125
මඩකලපුව	150
මොණරාගල	120
බදුල්ල	120
නුවරඑළිය	120
මහනුවර	120
මාතලේ	120
ගම්පහ	150
කුරුණෑගල	125
පුත්තලම	100
කළුතර	125
මන්නාරම	100
මුලතිව්	100
වව්නියා	100
කිළිනොච්චිය	150
එකතුව	**4,641**



රූපය 2.15 : ගෙවතු සංවර්ධනය කිරීම

2.2.6 දේශීය වටිනාකමක් සහිත පැළ නිෂ්පාදනය

වන ගහණය වැඩි කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන යටතේ රත්නපුර දිසාව මගින් දේශීය වටිනාකමක් සහිත වල්ලපට්ට පැල 100,000ක් නිෂ්පාදනය සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත.

2.2.7 වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපනය පිළිබඳ ක්ෂේත්‍ර වැඩසටහන (IUCN /IUFRO ආයතන අනුග්‍රහයෙන්)

- භූ දර්ශන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් ඉතා වැදගත් වන කළමනාකරණ සැලසුම් 3ක් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම (නකල්ස් සංරක්ෂණ වනාන්තරය, සිංහරාජ රක්ෂිතය හා රත්නපුර දිස්ත්‍රික්කය සඳහා).
- වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපනය පිළිබඳ ක්ෂේත්‍ර වැඩසටහන (IUCN /IUFRO ආයතන අනුග්‍රහයෙන්)
- හබරණ හුරුළු පාරිසරික වනෝද්‍යානය තුල ස්වාභාවික පුනර්ජනනයට ආධාර කිරීම සඳහා ආක්‍රමණික ශාක ඉවත් කිරීම හා නඩත්තු කිරීම
- ගල්ඔය පාරිසරික වනෝද්‍යානය තුළ හෙක්.20ක භූමි ප්‍රමාණයක ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමට සහය විම.(ANR-Assisted Natural Regeneration)
- හබරණ හුරුළු පාරිසරික වනෝද්‍යානය තුල හෙක්. 14.5 ක් ආක්‍රමණික ශාක ඉවත් කිරීම.
- අත්තනගල්ල වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපන සැලසුම් සකස් කිරීමේදි යොජනා වූ පරිදි අත්තනගල්ල ප්‍රදේශය තුළ ගෙවතු සඳහා පලතුරු පැල හා වෙනත් පැල බෙදාදීම, පරිසර සංරක්ෂණය සඳහා දැනුවත් කිරීම් පුවරු සවිකිරීම.
- 2023 දී ස්වභාවික පුනර්ජනනය පහසු කිරීම සඳහා හුරුළු රක්ෂිතයේ තෝරා ගත් ප්‍රදේශයක් (හෙක්ටයාර 20) නඩත්තු කිරීම
- 2023 වසරේ කන්නෙලිය, ඕපාත, රජවංගල විහාරස්ථානය ආශ්‍රිතව පර්ණාංග (කැකිල්ල / *Dicranopteris linearis)* බෝවී ඇති ඉඩමක ඖෂධීය ශාක උයනක් (හෙක්ටයාර් 0.4) ස්ථාපිත කිරීම.
- වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපන වැඩසටහනේ වැඩසැලසුම් සකස් කිරීම සඳහා හබරණ,කන්නෙලිය හා ගම්පහ යන පෙදෙස්වල ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම.

2.3 2023 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවූ අභියෝග

2.3.1 නව පාරිසරික සංචාරක ස්ථාන හඳුනා ගනිමින් එම ස්ථාන වැඩි දියුණු කරමින් පාරිසරික සංචාරක කටයුතු වඩාත් පුළුල්ව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.

2.3.2 මානව සම්පත් හිඟකම

කාර්යාල කාර්යමණ්ඩල වල පුරප්පාඩු පැවතීම නිසා කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇති අතර, කේෂ්ත්‍ර නිලධාරින් ප්‍රමාණවත් නොවීම නිසා වන කළමනාකරණ සැලසුම් සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහගත තත්ත්වයන් මතුව ඇත.

2.3.3 දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන කැලෑ ගිනි මැඩපැවැත්වීම අපහසු වීම.

2.3.4 ප්‍රමාණවත් මූලධන ප්‍රතිපාදන නොලැබීම

වාර්ෂිකව ලබාදෙන මූලධන ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීම හේතුවෙන් වාර්ෂිකව සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම අභියෝගයක්ව පවතී .

2.3.5 කේෂ්ත්‍ර කටයුතු සඳහා නවීන පහසුකම් හා නිලධාරින් හිඟයක් පැවතීම.

2.3.6 වන ආවරණය වැඩි කිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම.

ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේදී රාජ්‍ය අංශය ක්‍රියාත්මක වීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන්ගේ ආකර්ෂණය ලබා ගැනීම වඩා ඵලදායී වනු ඇත.

2.3.7 වාර්ෂිකව හෙක්ටයාර් 900 - 1000ත් අතර ප්‍රමාණයක් පරිණත වන වගා පූර්ණ හෙලීම් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත නිදහස් කරන අතර, හෙලීම් කිරීමෙන් පසු නැවත වන වගා කිරීම සඳහා ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණවත් වන්නේ සීමිත වන වගා ප්‍රමාණයක් ස්ථාපනය කිරීම සඳහා වීම වර්තමානයේ දී මුහුණ දීමට සිදු වී ඇති ප්‍රධාන අභියෝගයකි. පසුගිය වසර කිහිපය තුල පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ රාජ්‍ය දැව සංස්ථාව විසින් වාර්ෂිකව සිදු කරනු ලබන හෙලීම් ප්‍රමාණය ප්‍රමාද වීම මත නැවත වන වගා කිරීම ඉදිරි වර්ෂය වෙත ගෙන යාමට සිදු වීම නිසා නිෂ්පාදනය කරන ලද පැළ, තවාන් තුළ අමතර කාලයක් නඩත්තු කිරීමට ද මෙම ප්‍රතිපාදන වලින් කොටසක් යොදා ගැනීමට සිදු වී තීබේ. ඒ අනුව වන වගා ස්ථාපනයට සහ කළමනාකරණය කිරීම සඳහා වාර්ෂිකව ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් පරිදී ලබාදෙන්නේ නම් දැනට සිදු කරන ලබන නැවත වන වගා ප්‍රමාණය වඩා වැඩි ප්‍රමාණයක නැවත වනවගා සිදු කිරීමට හැකියාව පවතී.

2.4 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනාගත දැක්ම

2.4.1 අනාගත පරපුර හා ප්‍රජාවගේ පාරිසරික සාක්ෂරතාවය ඉහළ නැංවීම.

2.4.2 පරිසර සංචාරක ගමනාන්ත වලින් ලැබෙන ආදායම වැඩි කිරීම.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක පාරිසරික සංචාරක ගමනාන්ත තුලින් පසුගිය වසරේ රු.172,000,000ක ආදායමක් උපයා ඇත.දැනට ක්‍රියාත්මක සංචාරක ගමනාන්ත හඳුනාගෙන එය වැඩිදියුණු කිරීම තුලින් සංචාරක ආදායම වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

2.4.3 වනාන්තර වලින් ලැබෙන සේවාවන් ඉහල නැංවීම.

2.4.4 අනාගත දැව අවශ්‍යතාවයන් සැපයීමට අවශ්‍ය වානිජ වන වගාවන් ස්ථාපිත කිරීම.

2.4.5 වනාන්තර වලින් පිටත තුරු ආවරණ වැඩි කිරීම සඳහා පැල සිටුවීම.

03 පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(2023 වන සංරක්ෂණ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙන් උපුටා ගන්නා ලදී.)

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

වගුව 3.1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය


ඒඑසී-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	කණ්ඩායම 2023 රු.	කණ්ඩායම 2022 රු.	
-	ආදායම් ලැබීම්		1,861,087,997	2,214,517,511	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	121,693,246	133,201,789	ඒඑසී-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	1,739,394,752	2,081,315,722	
-	මුළු ආදායම් ලැබීම් (අ)		1,861,087,997	2,214,517,511	
60,000,000	ආදායම් නොවන ලැබීම්		2,575,316,622	2,433,509,148	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,550,930,000	1,418,310,000	ඒඑසී-3
-	තැන්පතු		942,775,949	937,438,092	ඒඑසී-4
60,000,000	අත්තිකාරම් ගිණුම්		81,610,673	77,761,056	ඒඑසී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
60,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		2,575,316,622	2,433,509,148	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		4,436,404,619	4,648,026,659	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		17,170,888	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		4,419,233,732	4,648,026,659	
	අඩු කළා : වියදම්				
1,800,100,000	පුනරාවර්තන වියදම්		1,767,611,823	1,581,485,167	
1,535,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,497,396,155	1,438,522,464	
252,100,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	262,233,459	134,176,340	ඒඑසී-2(ii)
13,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	7,982,208	8,786,363	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,800,100,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		1,767,611,823	1,581,485,167	
916,000,000	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
32,000,000	වැඩිදියුණු කිරීම්	10	31,792,853	17,846,027	
867,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	841,458,772	510,957,007	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑසී-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
10,000,000	හැකියා වර්ධනය	14	9,977,355	1,650,518	
7,000,000	වෙනත් මූලධන වියදම්	15	6,895,633	1,624,820	
916,000,000	මුළු මූලධන වියදම් (උ)		890,124,613	532,078,372	
	තැන්පතු ගෙවීම්		1,064,108,073	921,792,473	ඒඑසී-4
	අත්තිකාරම් ගෙවීම්		78,058,755	67,112,437	ඒඑසී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,142,166,828	988,904,910	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,799,903,264	3,102,468,449	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		619,330,468	1,545,558,210	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		620,528,257	1,545,354,268	ඒඑසී-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		(1,197,789)	203,940	ඒඑසී-3
			619,330,468	1,545,558,208	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගුව 3.2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්සා 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,714,970,273	4,210,202,677
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	210,989,437	214,541,355
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	(1,197,789)	203,940
මුළු වත්කම්		4,924,761,921	4,424,947,972
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(499,692,734)	(617,472,940)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,714,970,273	4,210,202,677
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	710,682,171	832,014,295
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	(1,197,789)	203,940
මුළු වගකීම්		4,924,761,921	4,424,947,972

පිටු අංක 07 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරව කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28-02-2024


ගණන්දීමේ නිලධාරි
නම :
ජී.නිහතුම්බ්. වීදිරිසිංහ
දිනය : 27-02-2024

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2024.02.27

ජේ.ඒ.ඩී.ඩී.ඩී. අලහකෝන්
ප්‍රධාන ඒකකාධිකාරි
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
"සම්පත්පාය", රජමල්වත්ත පාර,

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

වගුව 3.3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	රුකෝ 2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	984,023,231	883,541,688
ලාභ	-	-
ආදායම් තොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	306,429,317	127,009,207
අග්‍රිම ලැබීම්	1,550,930,000	1,418,310,000
අත්තිකාරම් අයකර ගැනීම්	84,490,558	80,099,637
නැත්පතු ලැබීම්	942,775,949	937,438,092
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	3,868,649,054	3,446,398,624
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	1,754,760,539	1,592,449,950
සහනාධාර සහ මාරුකිරීම්	7,982,208	8,786,363
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	57,565,480	344,795,253
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	17,170,888	-
අත්තිකාරම් ගෙවීම්	78,135,041	67,413,640
නැත්පතු ගෙවීම්	1,064,108,073	921,792,473
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,979,722,230	2,935,237,679
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	888,926,824	511,160,945
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	890,124,613	510,957,005
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	890,124,613	510,957,005
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(890,124,613)	(510,957,005)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(1,197,789)	203,940
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	(1,197,789)	203,940
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1.වාර්තාකරණ කාල පරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාල වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

2.මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3.ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4.දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5.දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6.මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

වගුව 3.4: ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු).	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස
1003: 07 :03	පුද්ගලික ඉඩම් වලින් දැව ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු	100,000	100,000	121,693	122
2002: 01: 02	රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම	1,600,000	1,600,000	1,739,394	109

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

වගුව 3.5: වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍යවියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,800,100	1,800,100	1,772,480.89	98.46
ප්‍රාග්ධන	916,000	916,000	890,124.61	97.17

3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගුව 3.6: මු.රේ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
102	මුදල් අමාත්‍යාංශය	ITMIS පුහුණු වැඩසටහන් සඳහා නිලධාරින් පුහුණු කිරීම වෙනුවෙන් ලබාදීම.	928.01	928.01	430.28	46.36
161	වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය	වන ගහණය වැඩි කිරීමට ප්‍රජා සහභාගීත්වය යටතේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා ලබා දීම.	50,000.00	50,000.00	47,789.95	95.57
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම ගිය නිලධාරින්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් ණය ශේෂ නිරවුල් කිරීමට ලබා දීම.	5,932.10	5,932.10	5,592.35	94.27
334	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව	ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා සනයේ ස්ථිර පත්වීම් ලබාගත් සහයකයින් වෙනුවෙන් ගෙවීම සඳහා ලබාදීම.	6,270.00	6,270.00	3,752.89	59.89

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වගුව 3.7: මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2023** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුවශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	398,913.24	398,913.24	-	-
9152	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	381,014.09	381,014.09	-	-
9153	ඉඩම්	3,925,343.90	3,925,343.90	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	9,614.48	9,614.48	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	84.54	84.54	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එන්ඩබ්එල්/ඒ/ඩිෆ්සි/02/එෆ්ඒ/2023/18

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 ජූනි 25 දින

වන සංරක්ෂක ජනරාල්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ගණන්දීමේ නිලධාරී වෙත යථාකාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොනිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2(අ)(ii)	2021 වර්ෂයේ රජයේ කැළැවලින් ලැබෙන ආදායම් ගිණුමෙහි උපලේඛන 05 අනුව පසුගිය වසරට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම රු.555,018,063 ක් වූවද, 2022 වර්ෂයට අදාළ ආදායම් ගිණුමෙහි සහ ඊට අදාළ හිඟ ආදායම් ප්‍රකාශයෙහි එය රු.488,264,949 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම රු.66,753,114 ක් අඩුවෙන් දක්වා තිබුණි.	1.6.1(අ)
1.6.2(අ)(iii)	2021 වර්ෂයේ රජයේ කැළැවලින් ලැබෙන ආදායම් ගිණුමට අදාළ හිඟ ආදායම් වාර්තාව අනුව 2022 ජනවාරි 01 දිනට රු.1,060,445,374 ක් වූ පෙර වර්ෂයන්ට අදාළ හිඟ ආදායම 2022 දෙසැම්බර් 31 දිනට රු.59,920,642 ක් වීමෙන් 2022 වර්ෂය තුළ පෙර වර්ෂ වෙනුවෙන් රැස්කළ හිඟ ආදායම රු.1,000,524,732 ක් විය. එසේ වූවද, 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමේ එම හිඟ ආදායම රු.901,779,894 ක් වශයෙන් දක්වා තිබීමෙන් රු.98,744,838 ක වෙනසක් නිරූපණය විය.	1.6.1(ආ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් වාර්තාවෙහි වර්ෂය අවසාන හිඟ ආදායම රු.2,095,359,351ක් ලෙස දක්වා තිබුණ ද, පෙර වර්ෂයේ හිඟ ආදායම් වාර්තාව අනුව ගැලපීම් කිරීමේදී වර්ෂය ආරම්භයේ පැවතිය යුතු හිඟ ආදායම වන රු.447,426,633 ට සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ප්‍රකාශනයෙහි පෙන්වා ඇති සමාලෝචිත වර්ෂය සඳහා හිඟ ආදායම රු.455,286,391ක් හා වර්ෂය තුළ අයකර ගැනීම් රු.1,106,450,075ක් ගැලපීමෙන් පසු වර්ෂය

අවසානයට හිඟ ආදායම ඉක්මවා රු.203,737,051ක වැඩිපුර අයකර ගැනීමක් නිරූපනය වේ. ඒ අනුව වර්ෂය අවසානයට පෙන්වා ඇති රු.2,095,359,351 ක හිඟ ආදායමේ නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි වූ අතර වර්ෂ ගණනාවක සිට හිඟ ආදායම් වාර්තා නිවැරදිව සකස් නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(ආ) රජයේ කැලෑවලින් ලැබෙන ආදායම්(2002.01.02) ශීර්ෂය යටතේ වෙනත් ආයතන විසින් රැස්කර තිබූ ආදායම රු.862,957,755 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.717,332,835 ක් ලෙස දක්වා තිබීමෙන් රු.145,624,920 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රජයේ කැලෑවලින් ලද තත්‍ය ආදායම රු.1,739,394,572 ක් වුවද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා තත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම් ප්‍රකාශයේ (ඒසීඒ-1(III)) එම අගය රු.179,394,752 ක් ලෙස රු.1,559,999,820 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) හිඟ ආදායම් වාර්තාවේ වාර්තා කරන වර්ෂයට අදාළ හිඟ ආදායම රු.455,286,391 ක් සහ සමාලෝචිත වර්ෂයේ අයකර ගත් හිඟ ආදායම රු.1,106,450,075 ක් වශයෙන් දක්වා තිබුණ ද, එම වටිනාකම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ 05) අනුව 2023 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.210,857,676 ක් වුවද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමට අදාළ දෙපාර්තමේන්තු පාලන ගිණුම් අනුව ණය ශේෂය රු.210,989,437 ක් විය. දෙපාර්තමේන්තු පාලන ගිණුම් ආරම්භක ශේෂයට රු.131,761 ක සාවද්‍ය ගැලපීමක් සිදු කිරීම ඊට හේතු වී තිබුණි.

(ආ) CC10 ලේඛනයට ඇතුළත් කර නොතිබුණු නිලධාරීන් 08 කුට අදාළ එකතුව රු.1,317,011 ක ආපදා ණය ශේෂයන් ආකෘතිය 3.1 හි කේවල ණය ශේෂ සාරාංශයට ඇතුළත් කර තිබීමෙන් එම ණය ශේෂවල නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාලවල අත්තිකාරම් කටයුතු සම්බන්ධයෙන් GPS මෘදුකාංගය හා මුරපදය නිවැරදිව භාවිතා නොකිරීම, ණය මුදල් නිවැරදිව අය නොකිරීම වැනි අඩුපාඩු පැවති නමුත් ඒවා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම රු.31,792,853 ක් හා මූලධන වත්කම් අත්පත් කර ගැනීම රු.841,458,772 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම්වල වැඩිවීම රු.873,251,625 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA 82) එම අගය රු.649,506,350 ක් ලෙස රු.223 ,745,275 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) 2022 වර්ෂයේ SA 82 වාර්තාවට අනුව එම වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් 05 ක අගය රු. 4,202,503,643 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට එම අගය රු. 4,045,324,877 ක් ලෙස රු. 157,178,766 කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ පුස්තකාල පොත් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

1.6.4 තැන්පත් ගිණුම් ශේෂය

මොණරාගල හා නුවරඑළිය දිසා වන කාර්යාලවල පවත්වාගෙන යන තැන්පත් ගිණුම් 03 කට අදාළව 2023 දෙසැම්බර් 31 දින වන විට වසර දෙක ඉක්මවූ එකතුව රු.17,378,163 ක තැන්පත් ශේෂයන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.5 අග්‍රිම ශේෂය

2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව රු.15,973,099 ක් වූ අග්‍රිම ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.17,170,888 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,197,789 ක වෙනසක් නිරීක්ෂණය විය. මුදල් රෙගුලාසි 427(2) අනුව මාසිකව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත්වල අග්‍රිම ගිණුම් සැසඳීම් සිදු නොකිරීම මේ තත්ත්වයන්ට හේතු වී තිබුණි.

1.6.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

අංක 01 සිට 24,020 දක්වා පුස්තකාල පොත් පිළිබඳ තොරතුරු ඇතුළත් පරිගණක ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණු අතර ඉදිරිපත් වූ පරිගණක ලේඛන 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1 (2006- සංශෝධිත) දරන චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කර විධිමත්ව පවත්වා නොතිබුණි.

1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ස්ථාවර වත්කම් ලේඛනය	2021 ජූලි 26 දිනැති රාජ්‍ය ගිණුම් SA/GFS/01/01/ 08 – VOLUME ii දරන ලිපිය	මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිකාවය පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් ලෙස පොත්පත් පවත්වාගෙන යායුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	CC10 ලේඛනය, ණය හා අත්තිකාරම් ණයගැනි ලේඛනය, ණයහිමි ලේඛනය හා අත්තිකාරම් පාලන ගිණුම	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	අත්තිකාරම් කටයුතු පිළිබඳව ප්‍රධාන කාර්යාලයේ සහ කලාප කාර්යාලවල පවතින ලේඛන යාවත්කාලීන කර විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ)	හානි හා පාඩු පිළිබඳ ලේඛනය	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල්	යාවත් කාලීන කර විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.

රෙගුලාසි 110

(ඇ)	බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214	බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඉ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 880 සහ මුදල් රෙගුලාසි 891	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප අය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නුවරඑළිය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යෑම සඳහා පුද්ගලික සමාගමකට ලබා දී තිබුණු භූමි ප්‍රමාණයට වඩා පර්චස් 72 ක් වැඩියෙන් 2016 වර්ෂයේ සිට පරිහරණය කර තිබුණු අතර එම සමාගම විසින් 2019 වසරේ සිට වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම නවතා තිබුණි. 2023 අගෝස්තු 24 දින වන විටත් ඉඩමේ අයිතිය තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පර්චස් 72 ක් සඳහාත්, 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පර්චස් 174 සඳහාත් අයවිය යුතු රු.5,435,860 ක බදු මුදල් වැට් බදු සමඟ අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) බදුල්ල, අම්පාර හා මොණරාගල දිසාවන් හි ගල් කොරි හිමියන් විසින් ගෙවීම පැහැර හැර තිබුණු පිළිවෙලින් රු.5,188,707 ක්, රු.34,147,382 ක් හා රු.7,604,227 ක් වන හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රජයට රු.46,940,316 ක ආදායමක් අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

2.2 අධිවැය

වාහන අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.3,454,665 ක පුනරාවර්තන වියදමක් ඊට අදාළ අංක 1301 දරන වැය විෂයයට හර නොකර මුදල් රෙගුලාසි 66 ට පටහැනිව අංක 2003 දරන ප්‍රාග්ධන වැය විෂයයට හර කර තිබුණි. ඒ අනුව එම පුනරාවර්තන වැය විෂයයෙහි 2023 දෙසැම්බර් 31 දිනට රු.328,527 ක ඉතිරියක් පෙන්නුම් කළ ද, ඉහත කී වියදම නිවැරදිව එම වැය විෂයයට හර කළේ නම් රු.3,126,138 ක අධිවැයක් ඇති වන බවට නිරීක්ෂණය විය.

2.3 **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාන්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.4 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
i. 3.7 ඡේදය	අළුතින් ලබා දුන් ණය මුදල් සඳහා වාරික හා අදාළ පොලි ඊට පසු මාසයේ සිටම අය කළ යුතු වුවද, 2022 දෙසැම්බර් මස නිලධාරීන් 07 දෙනෙකුට ගෙවන ලද රු.1,254,889ක ආපදා ණය මුදල් සඳහා වාරික අය කිරීම මාස 02ක සිට මාස 07ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබූ අතර අදාළ හිඟ ණය වාරික හා පොලී මුදල් අය කර ගැනීමකින් තොරව 2023 මාර්තු සහ අගෝස්තු යන මාසවල ණය අය කිරීම් ආරම්භ කර තිබුණි.
ii. XXIV පරිච්ඡේදයේ 4.1 ඡේදය	2023 දෙසැම්බර් 31 දිනට හිඟව පැවැති රු. 12,347,860 ක ණය ශේෂය තුළ මාස 03 ක සිට වසර 20 ක් දක්වා කාලයක් ඉක්මවා ගොස් තිබුණු රු.10,738,946 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 176(1)	මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාර හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 395	එක් එක් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර විගණනයට පරීක්ෂා කිරීම සඳහා සුදානම්ව තිබිය යුතු වුවත් 2023 වර්ෂයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ 26 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2004 මැයි 11 දිනැති අංක 171/2004 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය

GPS මෘදුකාංගය හරහා වැටුප් පිළියෙළ කිරීමේ දී පළමු, දෙවන හා තෙවන මුරපද නිලධාරීන් තිදෙනෙකු සතුව තිබිය යුතු වුවත්, මුරපද තුනම වැටුප් සකසන කළමනාකාර සහකාර නිලධාරී භාවිතා කරමින් තිබූ අතර එම මුර පද වසර ගණනක සිට වෙනස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛ මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 756(6)

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා ලබා ගැනීම මුදල් වර්ෂය අවසන් වී එළඹෙන මාර්තු 31 දින වන විට අවසන් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2024 මැයි වන විටත් අවසන් කර නොතිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ලේඛන සේවා මණ්ඩලයේ 2004/පුස/1 (2006-සංශෝධිත) චක්‍රලේඛය

i. 2 ඡේදය

පුස්තකාලයක් පවත්වාගෙන යන්නේ නම් උපදේශක කමිටුවක් තිබිය යුතු වුවත් උපදේශ කමිටුවක් පත්කර නොතිබුණි.

ii. 3.2 ඡේදය

පුස්තකාල ද්‍රව්‍ය භාරකාරීත්වය පැවරී ඇති නිලධාරියෙකු ස්ථාන මාරු ලබා යැමට හෝ විශ්‍රාම ගැන්වීමට හෝ මාස 3 කට පෙර තොග සමීක්ෂණයක් අනිවාර්යෙන්ම පැවැත්විය වුවත් දෙපාර්තමේන්තුවේ හිටපු පුස්තකාලාධිපතිනිය 2021පෙබරවාරි 19 දින තනතුරෙන් ඉල්ලා අස්වීමේ දී පොත් සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු නොකර එම නිලධාරිනියගේ ඉල්ලා අස්වීම පිළිගෙන සේවයෙන් නිදහස් කර තිබුණි.

iii. 4.1 ඡේදය

නැති වූ පුස්තකාල පොත් පරිග්‍රහණ ලේඛනයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත් ඇතැම් පොත් ඉවත් කිරීමට හේතුව සඳහන් නොකර පරිග්‍රහණ ලේඛනයෙන් තනි ඉරකින් කපා ඉවත් කර තිබුණි.

(ඊ) 2013 ජූනි 12 දිනැති හා අංක HAF/01/9/විවිධ දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය

සෑම ක්ෂේත්‍ර නිලධරයෙකුම ඉදිරි වැඩසටහන් හා ඉටුකළ වැඩසටහන් ලබාදිය යුතු වුවත්, ක්ෂේත්‍ර රාජකාරීවල නිරත නිලධාරීන්ගෙන් ඉදිරි වැඩසටහන් හා ඉටුකළ වැඩසටහන් කිසිවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබීමෙන් නිලධාරීන්ගේ කාර්යසාධනය මැන බැලීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවන බව නිරීක්ෂණය විය.

2.5 තැන්පතු

කලාප නියෝජ්‍ය වන සංරක්ෂක විසින් මොනරාගල දිසා වන කාර්යාලය වෙත 2019 වසරේ සිට 2022 වසර දක්වා නිශ්චිත කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.27,508,259 ක ප්‍රතිපාදනවලින් රු.16,802,150 ක මුදලක් එම කාර්යයන් සඳහා වියදම් නොකර විවිධ තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

වලස්මුල්ල අඩවි වන කාර්යාලය විසින් 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු පැල තවාන්වල දෛනික ගෙවීමේ පදනම මත වෙක්රෝල් කම්කරුවන් 1059 ක් ලියාපදංචි කර සේවයේ යොදවාගෙන තිබුණු අතර, එයින් 2021 ජනවාරි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය සඳහා රු.1,825,165 ක වැටුප් ගෙවන ලද කම්කරුවන් 200 දෙනෙකුගේ නම් හා ජාතික හැඳුනුම්පත් අංක මැතිවරණ කාර්යාල ඡන්දහිමි නාමලේඛනය සමඟ පරීක්ෂාවේ දී නිවැරදි නොවන බවට නිරීක්ෂණය වූයෙන් සත්‍ය වශයෙන් එම කම්කරුවන් තවාන්වල වැඩට යොදවාගත් බවට සනාථ කළ නොහැකි විය.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය ශූන්‍ය වූ අක්‍රිය බැංකු ගිණුම් 31 ක් පැවතිය ද ඒවා මූල්‍ය ප්‍රකාශ මඟින් හෙළිදරව් කර නොතිබූ අතර එම ගිණුම් වසා දැමීමට ද, කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 13 කට අදාළව 2023 දෙසැම්බර් මාසයේ බැංකු ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ රු.3,779,168 ක තැන්පතු කාලීනව පොත්පත් හා ලේඛන සමඟ සැසඳීම් කර හඳුනාගත හැකිව තිබිය දී හඳුනාගත නොහැකි තැන්පත් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි.

(ඇ) බැංකු සැසඳුම් ප්‍රකාශ CIGAS දත්ත පද්ධතිය ආශ්‍රයෙන් පිළියෙල කළ යුතු වුවද, ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන්ට ඒ පිළිබඳ මනා පුහුණුවක් සහ CIGAS මෘදුකාංග පහසුකම් ලබා නොදීම මත එම කාර්යාලවල බැංකු සැසඳුම් ප්‍රකාශ අතින් පිළියෙල කර තිබුණු බවට නිරීක්ෂණය විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

රට වැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් වනජ ද්‍රව්‍ය සඳහා වැඩි එන ඉල්ලුම සපුරාලීම මෙන්ම මනා පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසාර අයුරින් කළමණාකරණය කිරීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. එසේ වුවද, මෙම වාර්තාවේ දක්වා ඇති විවිධ කරුණු හේතුවෙන් වන සම්පත් සංවර්ධන හා සංරක්ෂණ කාර්යභාරය සහ අනෙකුත් කටයුතු කාර්යක්ෂමව ඉටුකර ගැනීමේ අභියෝගයකට මුහුණපෑමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.

3.1.2 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති නව ආකෘතිය භාවිතා නොකර පැරණි ආකෘතියට අනුව සකස් කර 2023 පෙබරවාරි 08 දින අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන තිබුණු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම 2023 සැප්තැම්බර් 19 දින ද, මුල්‍ය වර්ෂය අවසන් වී 2024 ජූනි 03 දින ද සංශෝධනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම මනා කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

3.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතින විශාල වනාන්තර ප්‍රමාණයක් රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කර ප්‍රසිද්ධයට පත් කිරීමට ප්‍රමාද කිරීම හේතුවෙන් රක්ෂිත වනාන්තර ආශ්‍රිතව අනවසර ඉඩම් අල්ලා ගැනීම් බහුලව සිදුවී ඇති අතර ඒවා රක්ෂිත භාවයෙන් නිදහස් කිරීමට සිදු වී තිබීමෙන් පවතින ස්වභාවික වනගහන ප්‍රතිශතය ක්‍රමයෙන් පහළ බැසීම තුළින් තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකි බව නිරීක්ෂණය කෙරේ. රක්ෂිත වනාන්තර ලෙස මොණරාගල දිසාව තුළ 2021 වර්ෂයෙන් පසු ගැසට් කර නොතිබුණු හෙක්ටයාර් 25,892 ක වනාන්තර 147 ක් ද, අම්පාර දිසාව තුළ 2019 වර්ෂයෙන් පසු ගැසට් කර නොතිබු හෙක්ටයාර 22,657.78 ක් වූ වනාන්තර 64 ක් ද පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂණයන්වලදී නිරීක්ෂණය විය.

(ආ) ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින්, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, නව ස්ථාන හඳුනා ගැනීම හා සැලසුම් සකස් කිරීම සඳහාත්, ක්‍රියාත්මක සංචාරක ස්ථාන වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහාත් නිසි පද්ධතියක් පවතින බවට නිරීක්ෂණය නොවුණු අතර මන්දාරම්නුවර සංචාරක කලාපය වැඩිදියුණු කිරීම හා කඳවුරු භූමි සඳහා ස්ථීර ආවරණ සකස් කිරීම වෙනුවෙන් රු.9,100,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් හා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබුණ ද එය ක්‍රියාත්මක කිරීම සඳහා ද කටයුතු කර නොතිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මාස 07 ක ප්‍රමාදයකින් පසු 2024 ජනවාරි 03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සතුව 2022 වර්ෂයේ දී වාහන 711 ක් පවතින බවට තොරතුරු ඉදිරිපත් වූ නමුත්ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු පවත්වා නොතිබුණි. කෙසේ වුවද, භෞතිකව පවතින වාහන සංඛ්‍යාව 2022 වර්ෂයේ 423 ක් හා 2023 වර්ෂයේ 676 ක් බවට සඳහන් කර තිබුණු අතර ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය සහ කොම්ප්ට්‍රෝල් ජනරාල් වෙත වාර්තා කර ඇති තොරතුරු අතර ද පරස්පරතාවයන් පවතින බවට නිරීක්ෂණය විය. එසේම වසරක පමණ කාලයක සිට අපහරණය සඳහා නිර්දේශිත වාහන 167 ක් හා අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා නොගත් අපහරණය සඳහා නිර්දේශිත වාහන 20 ක් පැවතීමත්, වෙනත් ආයතන සතු එහෙත් අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා නොගත් වාහන සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගෙන නොතිබීමත්, දෙපාර්තමේන්තු වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කර නොතිබීම යනාදී කරුණු අනුව ද වාහන සම්බන්ධ අභ්‍යන්තර පාලනය සතුටුදායක නොවන බවට නිරීක්ෂණය විය.

(ආ) වාහන නඩත්තු කිරීම, අපහරණය කිරීම, ආරක්ෂිතව ගාල් කිරීම ඇතුලුව වාහන කළමනාකරණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව තුළ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක්

ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් නුවරඑළිය, ත්‍රිකුණාමලය, අම්පාර සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්ට අදාලව වාහන 25 ක් අළුත්වැඩියා නොකර ගාල් කර තිබුණු අතර 2014 වර්ෂයේ දී ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනින් ලැබී ගෝමරන්කඩවල අඩවි වන කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අයිතිය පවරා නොගත් අංක WPJP 5391 දරන TATA සිංගල් වර්ගයේ කැබ් රථය භාවිතයෙන් තොරව දිරාපත්වීමට ඉඩහැර තිබුණි.

(ඇ) 2022 ජනවාරි 27 දින සන්නද්ධ කල්ලියකගේ ප්‍රහාරයකට ලක් වීමෙන් දැඩි ලෙස හානියට පත් වී තිබුණු කන්තලේ අඩවි වන කාර්යාලයේ රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණු අංක PF-9909 දරන කැබ් රථය අනතුරට ලක්වී වසර 02 කටත් අධික කාලයක් ගතවී ඇතත් පවතින නඩු කටයුතු අවසන් කර ගැනීම සඳහා කටයුතු නොකර නිෂ්කාර්යව ගාල් කර තැබීමෙන් තවදුරටත් අමතරඅළුත්වැඩියාවන් ඇතිවිය හැකි බවට නිරීක්ෂණය විය.

(ඈ) දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු නිසි අයුරින් සිදු කිරීම සම්බන්ධ වැඩ පිළිවෙලක් නොතිබීමෙන් නුවරඑළිය, ත්‍රිකුණාමල, අම්පාර, බදුල්ල සහ මොනරාගල යන දිස්ත්‍රික්ක තුළ පවතින ඇතැම් ගොඩනැඟිලි ඇතුළුව නිල නිවාස සහ කාර්යාල ගොඩනැඟිලි බොහෝමයක් අබලන් හා අනතුරුදායක තත්ත්වයක පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂාවන් හි දී නිරීක්ෂණය විය.

(ඉ) වන අපරාධ සම්බන්ධ නඩු කටයුතු අවසන් කිරීම සහ අවසන් වී ඇති නඩු සම්බන්ධව පසු විපරම් කිරීමේ කටයුතු ඉතා මන්දගාමීව පවතින බවත්, නඩු භාණ්ඩ වශයෙන් දෙපාර්තමේන්තු පරිශ්‍රවල රඳවාගෙන තිබෙන වාහන, උපකරණ සහ දැව විනාශ වීමේ තත්ත්වයක් පවතින බවත් නිරීක්ෂණය විය. අදාළ නඩු කටයුතු කාර්යක්ෂමව නිම නොකිරීම නිසා 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ අත්අඩංගුවට ගත් ට්‍රැක්ටර් හා අත් ට්‍රැක්ටර් 45 ක් ද, එලදායී ලෙස අපහරණය කිරීමට පියවර නොගත් ජංගම ඉරුම්හල් රැසක් සහ වන අපරාධ දැව රැසක් ද දිරාපත්ව මහියංගන අඩවි වන කාර්යාල භූමිය තුළ විනාශ වෙමින් පැවතුණි.

3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මොණරාගල දිසාවන කාර්යාලයේ 2021 හා 2022 වර්ෂයන්හි වාහන 03 කට සිදුවී තිබුණු අනතුරු ප්‍රධාන කාර්යාලයේ හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කර නොතිබීමෙන් එම හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදිව හෙළිදරව් නොවන අතර එයින් 2022 නොවැම්බර් 25 දින

අනතුරට ලක් වී අළුත්වැඩියාව සඳහා රු.324,000 ක් ඇස්තමේන්තු කර තිබුණු ජීප්රථයේ මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාව ද විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) 2021 දෙසැම්බර් 14 දින අනතුරට පත් වී තිබූ මොණරාගල දිසා වන කාර්යාලයට අනුබද්ධ අංක 252-4266 දරන කැබ් රථය හා 2022 ජනවාරි 13 දින අනතුරට පත්වී තිබූ අංක PF-9815 දරන කැබරථය අලුත්වැඩියා කිරීමේ වියදම පිළිවෙලින් රු.147,000 ක් හා රු.31,800 ක් වුවද, ඒ පිළිබඳව උසාවියට කරුණු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වුදිත පාර්ශ්වයන්ගෙන් අයකළ මුදල පිළිවෙලින් රු.18,000 ක් හා රු.15,000 ක් පමණක් වීමෙන් දෙපාර්තමේන්තුවට පාඩු සිදු වී තිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබුණු රෝපනය කරන ලද පැළ බෙදා හැරීමේ කාර්යය සඳහා සැළසුම්ගත වැඩ පිළිවෙලක් නොතිබීම හේතුවෙන් විවිධ වැඩසටහන් යටතේ පසුගිය වසර කිහිපයක් තුළ ප්‍රධාන පැල තවාන්වල නිෂ්පාදනය කරන ලද විවිධ වර්ගයේ පැළ 861,921 ක් පමණ ද, දියතලාව හමුදා කඳවුර හා සම්බන්ධ හෙක්ටයාර 42 ක නරියා කන්ද පයිනස් වන වගා භූමිය තුළ නැවත සිටුවීම සඳහා 2021 වර්ෂයේ රෝපණය කර තිබුණු පැළ 160,000 කින් බොහෝමයක් ද හානියට ලක් වී තිබුණු අතර වලස්මුල්ල අඩවි වන කාර්යාලයට අයත් පැළ තවාන් 04 ක සිටුවන ලද පැල 325,500 කින් සියයට 65 ක් වන පැල 210,759 ක් හානියට ලක්වීමෙන් වැයකර තිබුණු රු.10,145,508 ක් ද නිෂ්කාර්යය වියදම් වන බවට නිරීක්ෂණය විය. තවාන්වල පැල බෙදාහැරීමේ ප්‍රගතිය පිළිබඳ විස්තර ද විගණනයට ඉදිරිපත් නොවිය.

3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2023 ගිණුම් වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විමසුම් 04 ක් සඳහා මසකටත් වැඩි කාලයක් ගතවී තිබුණ ද පිළිතුරු ලබා දී නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව තුළ කැණීම් බලපත්‍ර නිකුත් කිරීම, පාලනය, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම සම්බන්ධයෙන් කාර්යක්ෂම හා සතුටුදායක අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් වනජ ද්‍රව්‍ය ඉවත් කිරීමේ දී විවිධ අක්‍රමිකතා, වන අපරාධ සහ පාරිසරික හානි විශාල ලෙස සිදු වී දෙපාර්තමේන්තුවට ආදායම් ද අහිමි වන බව ක්ෂේත්‍ර පරීක්ෂාවලදී

නිරීක්ෂණය විය. ඒ අතර නීතිරීති නොතකා කැණීම් සිදු කිරීමෙන් ගං ඉවුර සෝදාපාලුවට ලක්වී තිබීම, අනාරක්ෂිත ලෙස ඉවතලන ප්ලාස්ටික්, පොලිතීන් ආදිය පරිසරයට මුදාහැර තිබීම, එක් ප්‍රවේශ මාර්ගයක් වෙනුවට රක්ෂිතයට හානි සිදු කර මාර්ග කිහිපයක් සකස් කරගෙන තිබීම, "සී" බලපත්‍ර ලබා නොගෙන කැණීම් සඳහා වනයට ඇතුළු වීම, වාහන බලපත්‍රය රහිතව වැලි පැටවීම සඳහා වැලි මංකඩට ලොරි රථ ඇතුළු වීම, කොන්ත්‍රාත්කරුවන් විසින් බලපත්‍ර ලබා නොගත් කාලය තුළ ගල් කඩා ඉවත් කර ගැනීම, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පරිසර සංරක්ෂණයන් කෙරෙහි අවධානය යොමු නොකිරීම, ගිවිසුම් කොන්දේසි උල්ලංඝන කර කළුගල් කැඩීමෙන් පසු නිර්මාණය වූ විශාල වලවල්වල ජලය පිරී අනාරක්ෂිත පරිසරයක් නිර්මාණය වී තිබීම හා එම වලවල් වැසීම සඳහා කසළ බැහැර කර තිබීම යනාදී කරුණු ඒ අතර විය.

(ආ) කුළුණු සඳහා බලපත්‍ර අළුත් කිරීම පිළිබඳ විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් පැවැතිය යුතු වුවත් නුවරඑළිය දිසාවන කාර්යාල බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති දුරකථන සම්ප්‍රේක්ෂණ කුළුණු පිළිබඳ පසු විපරම් කිරීම් දුර්වලතාමත කුළුණු 06 කට අදාළ බලපත්‍ර අලුත් නොකිරීමෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වී ඇති අදායම රු.22,778,372 ක් විය.

(ඇ) රූපවාහිනී සේවා ආයතනයක් විසින් රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීම සඳහා 2006 වර්ෂයේදී විවිධ අවසර බලපත්‍රයක් මඟින් නුවරඑළිය කිකිලියාමාන යෝජිත රක්ෂිතයෙන් පර්චස් 35 ක බිම් කැබැල්ලක් වෙන් කරවා ගෙන තිබුණු නමුත් එම සම්ප්‍රේක්ෂණ කුළුණ ඉදිනොකර 2011 වර්ෂය තෙක් පර්චස් 01 ක් සඳහා රු.2,500 ක් බැගින් පර්චස් 35 ක් සඳහා බදු මුදල් ගෙවමින් වසර 06 කට ආසන්න කාලයක් බලපත්‍රයේ කාලය පමණක් දිර්ඝ කරගෙන තිබුණු අතර එම අවසර පත්‍රය අවලංගු කර නොගෙන 2012 වර්ෂයේ සිට බදු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වී ඇති වෙනත් අයකිරීම් රහිත ආදායම රු.1,050,000 ක් විය.

(ඈ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතින වනාන්තර තුළ වැලි කැණීම් සඳහා ගාස්තු අයකළ ද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ මත බලපත්‍ර නිකුත් කරන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ගාස්තු අය නොකරන බැවින් රජයට විශාල ආදායමක් අහිමි වී තිබුණි. සම්බන්ධිත ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගනිමින් රජය සතු සම්පත් බදු දීමේ දී ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම ඊට හේතුවී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014 දෙසැම්බර් 03 දිනැති හා අංක 1891/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රථම දැව ව්‍යාපාර

බලපත්‍ර වාර්ෂික ලියාපදිංචිය අළුත් කරවාගෙන දැව ව්‍යාපාර පවත්වාගෙන යා යුතු වුවද, ඇතැම් දැව ව්‍යාපාර හිමිකරුවන් බලපත්‍ර අලුත් කර නොගෙන ව්‍යාපාර පවත්වාගෙන යන බවට නිරීක්ෂණය විය. එහෙත් එම දැව ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය පිළිබඳ පසු විපරම් කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වනාන්තර ආශ්‍රිත ගිනි ඇතිවීමේ වඩාත් අවධානම් ප්‍රදේශයක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කය හඳුනාගෙන ඇති අතර එහි පවතින හෙක්ටයාර් 100,288 ක මුළු වනාන්තර ප්‍රමාණයෙන් සියයට 38.75 ක් වන හෙක්ටයාර් 38,863.58 ක් ගිනි අවධානම් භූමි ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබුණි. දෙපාර්තමේන්තුව තුළ පවත්නා ගිනි පාලන වැඩසටහන් හා ක්‍රමවේදයන් ප්‍රමාණවත් හා විධිමත් නොවීමෙන් ගිනි තැබීම් හේතුවෙන් වාර්ෂිකව විශාල භූමි ප්‍රමාණයක් හානියට පත්වෙන බව නිරීක්ෂණය විය.

(උ) අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් සෑම මාස 06 කට වතාවක් එක් එක් කැණීම් ස්ථාන ආශ්‍රිතව සිදු කරන ලද කැණීම් ප්‍රමාණය, සමෝච්ඡ රේඛා සිතියම් අනුව ගණනය කර අදාළ රජයේ ඉඩම් කළමනාකාරිත්වය හිමි ආයතනය, පුපුරණ ද්‍රව්‍ය පාලන අධිකාරිය හා කැණීම්කරු වෙත දැනුම් දිය යුතු වුවද, එම වාර්තා නියමිත කාලවකවානු තුළ ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් ගල්කොරි හිමිකරුවන් විසින් සීමාව ඉක්මවා සිදු කරන කැණීම් වෙනුවෙන් හිඟ ගාස්තු කාලීනව හා නිසියාකාරව අය කර ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඌ) අපේක්ෂිත වර්ධන කාලය සම්පූර්ණ වී ඇති වාණිජ වන වගා නියමිත කාලය තුළ හෙළීම පිණිස රාජ්‍ය දැව සංස්ථාවට මුදා හැර නොතිබීම හේතුවෙන් වසර ගණනාවක් පැරණි වගාවන්වලට ස්වාභාවික හේතූන් සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන හානි හා වන අපරාධ නිසා උපරිම දැව ඵලදාවක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීමෙන් හා වන වගා බිම් සංවර්ධනය මඟින් දේශීය පරිභෝජනය හා අපනයනය සඳහා අවශ්‍ය වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම පසු බෑමකට ලක්වන බව නිරීක්ෂණය විය.

(එ) පූර්ණ හෙළීම් සඳහා 2021 වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව වෙත භාරදෙන ලද වන වගා 05 ක් නියමිත කාලය තුළ හෙළීම් කිරීමට කටයුතු කර නොතිබීම නිසා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුව නැවත වන වගා කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. එම නිසා කවාන්වල රෝපණය කරන ලද පැළ හානියට පත්වීමෙන් හා නඩත්තු කටයුතු සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීමෙන් වන පාඩුව වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඒ) ගෝමරන්කඩවල අඩවි වන කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යාං ඔය ආශ්‍රිත පලෙයිඉරක්කම් වැලි මංකඩ පිහිටි ස්ථානය, යාං ඔය ඩෙල්ටාව ආසන්නයේ පිහිටා ඇති නිසා යාංඔය පිටාර ගැලීම් තුළින් ඇතිවන වගුර බිම් ආශ්‍රිත කුඩා ජීවී ප්‍රජාවගේ බිහි වීමට ආවේනික පරිසරයක් නිර්මාණය වන බවත්, සංචාරක පක්ෂීන්ට අවශ්‍ය ආරක්ෂාව, කැමබීම සහිත සංවේදී පරිසරයක් ලෙස හඳුනාගෙන තිබීමත්, කඩොලාන ඇතුළුව වෙනත් විශේෂ ශාක වලින් සමන්විත වෘක්ෂලතා පද්ධතියක් නිරීමාණය වී තිබීමත් හේතුවෙන් එම භූමි ප්‍රදේශය පාරිසරික වශයෙන් ඉතා ඉහළ වටිනාකමකින් යුතු භූමි ප්‍රදේශයක් බව හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය. එම නිසා මෙම භූමි ප්‍රදේශය සංරක්ෂිත වනාන්තරයක් ලෙස ආරක්ෂා කළ යුතු වුවත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ රක්ෂිත වනයක් ලෙස පාලනය නොවන බැවින් ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මත වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම තුළින් ඉතා විශාල හානියක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

"වනාන්තර ආරක්ෂා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම" සහ "භෞමික පරිසර පද්ධති හා තිරසාරව කළමනාකරණය කරන ලද වනාන්තර ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, කාන්තාරකරණයට එරෙහිව කටයුතු කිරීම, ජෛව විවිධත්ව හානිය වැලැක්වීම" වශයෙන් 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන තිබුණු ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු 5 ක් යටතේ 2030 වර්ෂය වන විට වන ආවරණය සියයට 32 ක් දක්වා වැඩි කිරීම ඉලක්ක කර තිබුණි. එහෙත්, වනාන්තර රක්ෂිත ලෙස තහවුරු කිරීමට ප්‍රමාද වීම මත අනවසර ඉඩම් අල්ලා ගැනීම පාලනය කිරීමට නොහැකිවීම, පාරිසරික වශයෙන් ඉතා ඉහළ වටිනාකමකින් යුත් භූමි ප්‍රදේශයන් තුළ කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් සැපයීමට අපොහොසත් වීම යන කරුණු හා වෙනත් සිද්ධීන් බහුලව පවතින බැවින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දැඩි අභියෝගවලට මුහුණ පෑමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ රු.3,229 ක් වූ අනුමත, කාර්ය මණ්ඩලයෙන් 617 ක් පුරප්පාඩු වී පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නියෝජ්‍ය හා සහකාර වන සංරක්ෂක නිලධාරීන් 49 ක් ද, තෘතියික මට්ටමට අයත් වන පාලක (විශේෂ) හා දිසා වන නිළධාරීන් 26 ක් ද, ද්විතීක මට්ටමට අයත් අඩවි වන නිළධාරීන් 291 දෙනෙකු හා බීට්ටු වන නිළධාරීන් 251 දෙනෙක් ද ඒ අතර විය. එම

තනතුරු පුරප්පාඩුව ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සහ වන අපරාධ වැලැක්වීම කෙරෙහි හා අරමුණු හා ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහිත් බලපා ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	89	40	49
තෘතියික	44	18	26
ද්විතික	1,462	1,171	291
සුළු	1,634	1,383	251
එකතුව	3,229	2612	617

ආර්.එම්.එම්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

4.1 කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධක දර්ශක පහත පරිදි වේ)

වගුව 4.1 : කාර්යසාධන දර්ශක

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස(%) නිමැවුම තත්‍ය		
		100%- 90%	**75%-89%**	**50%- 74%**
1	ගොඩනැගිලි 30 ක් හා වාසභයන් නඩත්තු කිරීම	100%	-	-
2	වාහන නඩත්තු කිරීම (වැය ශීර්ෂ අංක 014)	99%	-	-
3	ඉන්ධන ලබාගැනීම (වැය ශීර්ෂ අංක 009)	99%	-	-
4	වාහන අලුත්වැඩියාව (වැය ශීර්ෂ අංක 203)	100%	-	-
5	උපකරණ හා යන්ත්‍ර ලබා ගැනීම	100%	-	-
6	කාර්යාල හා විද්‍යුත්උපකරණ නඩත්තු කිරිම	100%	-	-
7	මෘදුකාංග සංවර්ධනය	100%	-	-
8	හෙක්.3933ක ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලද වනාන්තර නඩත්තු කිරීම.	98%	-	-
9	හෙක්. 341.5ක ප්‍රතිෂ්ඨාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම.	97%	-	-
10	හෙක්. 302ක කඩොලාන වනාන්තර පවත්වාගෙන යාම හා නඩත්තුව	95%	-	-
11	හෙක්. 47ක රණවිරු රුක්රෝපණය හා නඩත්තුව	93%	-	-
12	හෙක්. 622ක වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත ඉඩම් නඩත්තු කිරීම.	96%	-	-
13	හෙක්.130ක වනාන්තර බවට පත් කළ අතහැර දමන ලද ගෙවතු ඉඩම් නඩත්තු කිරීම	98%	-	-
14	හෙක්. 180ක ආක්‍රමණශීලී ශාඛ ඉවත් කිරීම හා එම ප්‍රදේශ නඩත්තු කිරීම.	96%	-	-
15	හෙක්. 195ක වැව් තාවුළු සංරක්ෂණය සඳහා සිටුවන ලද පැළ නඩත්තු කිරීම	94%	-	-
16	ආගමික ස්ථානවල රුක් සිටුවීම හෙක්ටයාර් 4ක් නඩත්තු කිරීම.	98%	-	-
17	ගිනි නිවන උපකරණ 18ක් මිලදී ගැනීම සහ නඩත්තු කිරීම	90%	-	-
18	කි.මී. 25ක ගිනි පට්ටි ස්ථාපනය කිරීම	99%	-	-
19	ගිනි පාලන වැඩසටහන් 72ක් ක්‍රියාත්මක කිරීම	96%	-	-
20	වන ආරක්ෂණය සඳහා වන අපරාධ මැඩලීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවශ්‍ය වන ව්‍යදම් පියවීම I. ආරක්ෂක උපකරණ සැපයීම.	91%	-	-

	II. ආරක්ෂණ ජලජ පරිසර පද්ධතියක් සඳහා බෝට්ටු සැපයීම.වන අපරාධ වැලැක්වීම් පිළිබඳ පුහුණු වැඩසටහන්. III. අඩවි කාර්යාල මට්ටමින් කුඩා අවි ගබඩාවක් ඉදිකිරීම. IV. වන ආරක්ෂණ කටයුතු සහ රාත්‍රී මුර සංචාරය සඳහා ඉන්ධන සැපයීම.			
21	ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 200 ක් සකස් කිරීම.	100% +	-	-
22	වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුමක් සකස් කිරීම (සිංහරාජ වනාන්තර සංකීර්ණය සඳහා)	100%	-	-
23	වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05 ක් පැවැත්වීම (උතුරු මැද නැගෙනහිර කලාපය , උතුරු කලාපය , දකුණ /සබරගමුව කලාපය , වයඹ /බස්නාහිර කලාපය , මධ්‍යම /ඌව කලාපය) සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය විසින් ප්‍රතිපාදන ලබා දී ඇත.	-	80%	-
24	වන ආවරණ සිතියම් සකස් කිරීම.	100%	-	-
25	කි.මී.940ක වනාන්තර මායිම් සලකුණු කිරීම. (ජනාධිපතිතුමන්ගේ කැබිනට් පත්‍රිකාව අනුව උතුරු, නැගෙනහිර හා උතුරු මැද පලාත්වල මායිම් ගැටලු නිරාකරණය කිරීමෙන් පසු මායිම් සලකුණු කිරීමට ලද උපදෙස් අනුව 2023 වර්ෂයට අදාලව මෙම වැඩසටහන් නැවැත්වීමට සිදු විය)	0%	-	-
26	කි.මී. 873.25ක වනාන්තර මැනුම් කිරීම.	-	-	54.57%
27	නාම පුවරු 492ක් සවි කිරීම.	199.5%	-	-
28	ජාතික වන සංගණන නියැදි 751ක දත්ත ලබා ගැනීම (NFI)	95.5%	-	-
29	හෙක්. 1800ක ස්ථාපිත කෘෂි වන වගා පවත්වාගෙන යාම / නඩත්තු කටයුතු.	-	75%	-
30	පැළ තවාන් නඩත්තුව (පැළ මිලියන 1.5)	100%	-	-
31	පැළ තවාන් 11ක් සංවර්ධනය කිරීම	100%	-	-
32	හෙක්. 100ක වෙරළ වන වගා පවත්වාගෙන යාම/ හෙක්. 46ක නඩත්තු කටයුතු සිදු කිරීම.	-	-	46%
33	හෙක්. 25ක වෙරළ වන වගා සැකසීම.	100%	-	-
34	වන ව්‍යාප්ති වැඩසටහන් 1000ක් පැවැත්වීම.	100%	-	-
35	ගෙවතු සංවර්ධන වැඩසටහන් 1000ක් පැවැත්වීම.	100%	-	-
36	බීජ පැළ 300,000ක් නිෂ්පාදනය කිරීම.	90%	-	-
37	පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් 25ක් සිදු කිරීම.	100%	-	-
38	හෙක්. 631.31ක වාණිජ වන වගා ස්ථාපිත කිරීම (RCT)	-	83.68%	-
39	හෙක්. 716.31ක පැළ තවාන් නඩත්තුව (පැළ 1,217,200)	100%	-	-

40	හෙක්. 4808.34 වානිජ වන වගා නඩත්තුව	100%	-	-
41	හෙක්. 408.4ක වන සංගණන හා ගස් ලැයිස්තු සකස් කිරීම	100%	-	-
42	හෙක්. 50ක කඳු මුදුන් වන වගා නඩත්තුව සිදු කිරීම.	100%	-	-
43	පොලිතීන් කවර(9x4) ලක්ෂ 25ක් මිලදී ගැනීම.	100%	-	-
44	හෙක්. 1033ක කැබිලිත්ත වන වගා නඩත්තු කටයුතු සිදු කිරීම.	100%	-	-
45	හෙක්. 40ක කැබිලිත්ත වන වගා ස්ථාපනය සිදු කිරීම.	100%	-	-
46	කි.මී. 2.2ක ස්වාභාවික මං පෙත් හා කි.මී. 64ක අභ්‍යන්තර සෆාරි ජීප් රථ මාර්ග සංවර්ධනය හා නඩත්තුව සිදු කිරීම.	100%	-	-
47	පාරිසරික ගමනාන්ත 23ක ඇති පාරිසරික සංචාරක බංගලා 23ක සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම.	100%	-	-
48	විශේෂ සංවර්ධන කටයුතු (පාරිසරික සංචාරක) සිදුකිරීම.	100%	-	-
49	නව සංචාරක ස්ථාන හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම.	100%	-	-
50	පාරිසරික සංචාරක මධ්‍යස්ථානවලට අදාල ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කිරීම.	100%	-	-
51	පාරිසරික සංචාරක මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදුකිරීම.	100%	-	-
52	පවත්නා පර්යේෂණ 09ක් නඩත්තු කිරීම.	100%	-	-
53	නව අත්හදා බැලීම්, පර්යේෂණ 03ක් ස්ථාපනය හා සංවර්ධනය කිරීම.	100%	-	-
54	තවාන් හා විද්‍යාගාර පර්යේෂණ සිදුකිරීම	95%	-	-
55	පර්යේෂණ පත්‍රිකා 06ක් සැකසීම.	100%	-	-
56	බීජ උද්‍යාන කළමනාකරණයක් සිදුකිරීම.	100%	-	-
57	බීජ එකතු කිරීම.	-	-	51%
58	කුඹල්පොල හා බදුල්ල පර්යේෂණ ඒකක පවත්වාගෙන යාම	100%	-	-
59	NVQ පාඨමාලා පැවැත්වීම.	100%	-	-
60	ධාරිතා සංවර්ධන 1/2023 අයවැය චක්‍රලේඛ අනුව සැලසුම්කරන ලද පුහුණු සිදුකිරීමටනොහැකි විය. *නවක පත්වීම් ලද වන ක්ෂේත්‍ර සහකාරවරුන්100 ක් සඳහා දින 5ක පුහුණුව ලබාදීම * තොරතුරු තාක්ෂණ නිලධාරීන් 2ක් සඳහා දින 2ක පුහුණු ලබාදීම * රාජ්‍ය භාෂා දෙමළ පාඨමාලාව සඳහා නිලධාරීන් 200ක් යොමු කිරීම(පැය 150 පාඨමාලා 2) * මාතර දිසාවන නිලධාරී කාර්යාලයේ නිලධාරීන් හට SMART කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව ලබාදීම	100%	-	-

	* භූවිද්‍යා තොරතුරු හා වන සංගණන අංශයේ මගින් ක්ෂේත්‍ර නිලධාරින්ට 60ක් සඳහා QGIS පුහුණුවක් ලබාදීම.			
61	කි.මී. 40.75ක මාර්ග දෙපස රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	100%	-	-
62	නාගරික තුරු ගොමු ස්ථාපනය සිදුකිරීම.	100%	-	-
63	හෙක්.424ක කෘෂි වනවගා ස්ථාපනය සිදුකිරීම.	100%	-	-
64	කෘෂි වනවගා සඳහා තේක්ක මුල් 100,000ක් නිෂ්පාදනය සිදු කිරීම.	100%	-	-
65	ගෙවතු 4641ක් සංවර්ධනය සිදුකිරීම.	100%	-	-

05 පරිච්ඡේදය
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

වගුව 5.1 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණ	තිරසර සංවර්ධන ඉලක්කය	දෙපාර්තමේන්තු ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය,තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණය ට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම	15.1. 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධතිය සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන් විශේෂ වනාන්තර කදු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නඟා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.	2030දී 32% දක්වා වන ආවරණය වැඩි කිරීම				
		2023 ඉලක්ක				
		1. කි.මී. 940ක වනාන්තර මැනීම් හා මායිම් සලකුණු කිරීම.	-	0%	-	-
		2. කි.මී.200ක වනාන්තර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සඳහා සිතියම් ගත කිරීම	-	-	-	100%
		3.හෙක්.31,000ක වනවගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා දත්ත රැස් කිරීම	-	0%	-	-
		4. පවත්නා පර්යේෂණ 09ක් නඩත්තු කිරීම.	පවත්නා පර්යේෂණ 09ක් නඩත්තු කිරීම අවසන් කර ඇත.	-	-	100%
		5. නව අත්හදා බැලීම්, පර්යේෂණ 03ක් ස්ථාපනය හා සංවර්ධනය කිරීම.	a.ලුණුම්දෙල්ල හා Toona cil-iata ශාක වර්ධක ප්‍රචාරණය යටතේ	-	-	100%

			තෝරාගත් මව්ශාක වලින් පැල නිෂ්පාදනය කිරීමට මූලික පර්යේෂණ කටයුතු සිදුකර ඇත. b. තේක්ක බීජ උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය බද්ධ පැල නිෂ්පාදනය සඳහා ග්‍රාහක පැල 500 ක් නිපදවා ඇත. c. පටක රෝපිත තේක්ක පැල හා සාමාන්‍ය තේක්ක පැල සංසදානාත්මක පර්යේෂණයක් ලෙස ක්ෂේත්‍රයේ පිහිටුවා ඇත.			
		6. තවාන් හා විද්‍යාගාර පර්යේෂණ සිදුකිරීම	a. පටක රෝපිත තේක්ක පැල හා වල්ලපට්ට පැල හුරුවීම සඳහා පොලිබෑග් වලට මාරුකර ඇති අතර ඒවා හොඳින් වැඩේ. b. පලු හා කැන්ද බීජ ප්‍රරෝහණ කටයුතු සිදුකර ඇත	-	-	95%

	15.2. 2020 වන විට සියළුම වර්ග වල වනාන්තර තිරසර අන්දමින් කළමණාකරණය කිරීම, ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්ත්වයට පත් කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගා වර්ධනය කිරීම.	1. හෙක්. 47ක රණවිරු රුක්රෝපණය හා නඩත්තු සිදු කිරීම.	වගා කරන ලද භූමිය.	-	-	93%
		2. හෙක්. 302ක කඩොලාන වනාන්තර පවත්වාගෙන යාම හා නඩත්තු සිදු කිරීම.	කඩොලාන සංරක්ෂණය කරන ලද භූමිය.	-	-	95%
		3.වැව් තාවුළු සංරක්ෂණය සඳහා හෙක්.195ක සිටුවන ලද පැළ නඩත්තු කිරීම	සංරක්ෂණය කරන ලද වැව් තාවුළු.	-	-	94%
		4. හෙක්. 754.45ක වානිජ වන වගා ස්ථාපිත කිරීම. (RCT)	හෙක්ටයාර් 631.31 ක් වානිජ වනවගා ස්ථාපිත කිරීම	-	-	83.67 %
		5. හෙක්. 40ක කැබිලිත්ත වන වගා ස්ථාපනය සිදු කිරීම.	හෙක්ටයාර් 40 කැබිලිත්ත වනවගා ස්ථාපනය	-	-	100%
		6. හෙක්. 424ක කෘෂි වන වගා ස්ථාපනය සිදු කිරීම.	හෙක්. 423.55ක කෘෂි වන වගා ස්ථාපනය සිදු කිරීම.	-	-	100%
		7. හෙක්.3933ක ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලද වනාන්තර නඩත්තු කිරීම.	වන වගා ප්‍රතිස්ථාපිත කරන ලද භූමිය	-	-	98%
		8. හෙක්. 341.5ක ප්‍රතිෂ්ථාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම	වන වගා කරන ලද භූමිය	-	-	97%
		9. හෙක්. 623ක වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත ඉඩම් නඩත්තු කිරීම	වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත භූමිය	-	-	96%
		10.හෙක්.130ක වනාන්තර බවට පත් කළ අතහැර දමන ලද ගෙවතු	වනාන්තර බවට පත් කළ අතහැර දමන	-	-	98%

		ඉඩම් නඩත්තු කිරීම	ලද ගෙවතු සහිත භූමිය			
		11.ආගමික ස්ථානවල රුක් සිටුවීම හෙක්ටයාර් 4ක් නඩත්තු කිරීම	වන වගා කරන ලද භූමිය	-	-	98%
		12. කි.මී. 25ක ගිනි පටි ස්ථාපනය කිරීම	ගිනි පටි ස්ථාපනය කිරීම	-	-	99%
		13.ගිනි පාලන වැඩසටහන් 72ක් ක්‍රියාත්මක කිරීම	ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	-	-	96%
		14.ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 50ක් සකස් කිරීම	ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 200ක් සකස් කිරීම	-	-	100% +
		15.වන සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් 01ක් සකස් කිරීම.	සිංහරාජ වනාන්තර සංකීර්ණය සඳහා යාවත්කාලීන කරන ලද සාර්ව වන කළමනාකරණ සැලසුම සකස් කර ඇත.	-	-	100%
		16.වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05ක් පැවැත්වීම (උතුරු මැද නැගෙනහිර කලාපය, උතුරු කලාපය, දකුණු/සබරගමුව කලාපය, වයඹ බස්නාහිර කලාපය, මධ්‍යම ඌව කලාප සඳහා) සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය	වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 04ක් පවත්වා ඇත. (උතුරු මැද නැගෙනහිර කලාපය, උතුරු කලාපය, දකුණු/සබරගමුව කලාපය, මධ්‍යම ඌව කලාපය)	-	-	80%

		විසින් ප්‍රතිපාදන ලබා දී ඇත.				
		17.හෙක්. 1800ක ස්ථාපිත කෘෂි වන වගා පවත්වාගෙන යාම / නඩත්තු කටයුතු.	හෙක්. 1351.35ක ස්ථාපිත කෘෂි වන වගා පවත්වාගෙන යාම / නඩත්තු කටයුතු.	-	-	75%
		18.හෙක්. 100ක වෙරළ වන වගා පවත්වාගෙන යාම/ නඩත්තු කටයුතු සිදු කිරීම.	හෙක්.46ක වෙරළ වන වගා පවත්වාගෙන යාම/ නඩත්තු කටයුතු සිදු කිරීම.	46%	-	-
		19. හෙක්. 25ක වෙරළ වන වගා සැකසීම.	හෙක්. 25ක වෙරළ වන වගා සැකසීම	-	-	100%
		20.වන ව්‍යාප්ති වැඩසටහන් 1000ක් පැවැත්වීම.	වන ව්‍යාප්ති වැඩසටහන් 1064ක් පැවැත්වීම.	-	-	100%
		21.ගෙවතු සංවර්ධන වැඩසටහන් 1000ක් පැවැත්වීම.	ගෙවතු සංවර්ධන වැඩසටහන් 1000ක් පැවැත්වීම.	-	-	100%
		22.පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් 25ක් සිදු කිරීම.	පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් 484ක් සිදු කිරීම	-	-	100%
		23.හෙක්. 4453.34 නොමේරූ වනවගා නඩත්තු	4808.34 ක වනවගා නඩත්තු කිරීම	-	-	100%
		24.හෙක්. 1033ක කැබිලිත්ත වන වගා නඩත්තු කටයුතු සිදු කිරීම.	හෙක්ටයාර් 1033ක කැබිලිත්ත වනවගා නඩත්තුව	-	-	100%
		25.කි.මී.36ක මාර්ගදෙපස රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	කි.මී.40.75ක මාර්ගදෙපස රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	-	-	100%
		26. නාගරික තුරු ගොමු ස්ථාපනය සිදුකිරීම.	නාගරික තුරු ගොමු 20ක් ස්ථාපනය සිදුකිරීම	-	-	100%

		27.විශේෂ සංවර්ධන කටයුතු (පාරිසරික සංචාරක) සිදුකිරීම.	1.කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය ේ ආරක්ෂිත පැති බැම්ම ඉදි කිරීම. 2.කන්නෙලිය ආපන ශාලාව ඉදි කිරීම. 3.අඩාහැලෙන ඇල්ල නව ප්‍රවේශ පත්‍ර කවුළු ඉදි කිරීම. 4. හඳුනාගත් ස්ථාන වල නව කඳවුරු භූමි 3 ක් ඉදි කිරීම. (කණ්ඩලම, ගල්විල සහ ඔහීය)	-	-	100%
		28.පාරිසරික සංචාරක මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදුකිරීම.	පාරිසරික සංචාරක මධ්‍යස්ථාන 16ක් නඩත්තු කර ඇත. (සිංහරාජ පිටදෙනිය/කුඩව, නකල්ස් - මාතලේ, නුවර/ කන්නෙලිය/ කුරුළු කැලය/ මාකන්දාව/ ගල්ඔය/ හුරුළු/ එක්ගල්ඔය/ නුවරගල/ ඇල්ල රොක්/ ඔහීය/උඩවත්ත කැලේ/ හිරිකටු ඔය/ අඩාහැලෙන ඇල්ල)	-	-	100%
		29.පාරිසරික ගමනාන්ත 23ක ඇති පාරිසරික සංචාරක බංගලා 23ක සංචාරකයන් සඳහා අවශ්‍ය	1.කොස්ගුලන පරිසර ලැගුම්හල 2.හිරිකටු ඔය කඳවුරු	-	-	100%

		පහසුකම් වැඩිදියුණු කිරීම.	බැඳීමේ ස්ථානය 3.කන්නෙලිය සංචාරක මධ්‍යස්ථානය 4.දොතලුගල කඳවුරු බැඳීමේ ස්ථානය 5.මාතලේ පරිසර ලොජ් 6.ඇල්ල රොක් කඳවුරු බැඳීමේ ස්ථානය 7.ඔහිය කඳවුරු භූමිය 8.ගල්ඔය පරිසර ලැගුම්හල 9.එක්ගල් ඔය කඳවුරු බැඳීමේ ස්ථානය			
	15.4. 2030 වන විට තිරසර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ප්‍රතිලාභ ගෙන දීමට ඒවායේ ධාරිතාව නැංවීම සඳහා ජෛව විවිධත්වයද සමඟින් කඳුකර පරිසර පද්ධති සංරක්ෂණය කිරීම තහවුරු කිරීම.	1. හෙක්. 50ක කඳු මුදුන් වන වගා නඩත්තුව සිදුකිරීම.	හෙක්ටයාර් 50 කඳුමුදුන් නඩත්තුව සිදු කිරීම	-	-	100%
	15.8. 2020 වන විට ගොඩබිම සහ ජලයේ පරිසර පද්ධති වල වෙසෙන ආක්‍රමණික පිටස්තර ජීව විශේෂයන් අලුතින් හඳුන්වාදීම සහ ඔවුන්ගෙන් සිදු වන බලපෑම් කැපී පෙනෙන ලෙස අඩු	1. හෙක්. 180ක ආක්‍රමණශීලී ශාඛ ඉවත් කිරීම හා එම ප්‍රදේශ නඩත්තු කිරීම.	ආක්‍රමණශීලී ශාඛ ඉවත් කිරීම හා එම ප්‍රදේශ නඩත්තු කිරීම.	-	-	96%

	කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වාදීම සහ මෙම විශේෂයන් පාලනය හෝ තුරන් කිරීම.					

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 ජයග්‍රහණ

01.පොලොන්නරුව දිසාව තුල හබරණ අඩවියේ ගල්ඔය පාරිසරික උද්‍යානය ඉදි කල 2023 වසරේදී සංචාරකයන් සඳහා විවෘත කරන ලදී.

02. කැබිලිත්ත වනවගා ස්ථාපනය හා නඩත්තු සිදු කිරීම

හෙක්: 40ක කැබිලිත්ත වනවගා ස්ථාපනය හා හෙක්:1033ක වනවගා නඩත්තු කටයුතු සිදු කිරීම.

5.2.2 අභියෝග

01.වන ආවරණය වැඩි කිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම.

ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේදී රාජ්‍ය අංශය ක්‍රියාත්මක වීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන්ගේ ආකර්ෂණය ලබා ගැනීම වඩා ඵලදායී වනු ඇත.

මේ වෙනුවෙන් දේශීය පෞද්ගලික අංශයන්ගේත් විදේශීය අංශයේත් මූල්‍ය දායකත්වයක් ලබාගත හැකි පරිදි රාජ්‍ය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදු කලයුතු අතර ඒ තුලින් අපේක්ෂිත 32% ඉලක්කයට ළඟා වීම වඩා කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව ඇත.

02.වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කළ ද භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අපේක්ෂිත මට්ටමෙන් සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම.

03.නව පාරිසරික සංචාරක ස්ථාන හඳුනා ගනිමින් එම ස්ථාන වැඩි දියුණු කරමින් පාරිසරික සංචාරක කටයුතු වඩාත් පුළුල්ව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.

04. කාර්යාල කාර්යමණ්ඩලවල හා ක්ෂේත්‍ර කාර්යමණ්ඩලවල පුරප්පාඩු පැවතීම.

05. 2023 වර්ෂයේ ඉලක්කගත වනාන්තර මැනීම් හා මායිම් සලකුණු කිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින වනාන්තර සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය යන මාතෘකාවට අදාළව 2023.01.31 දිනැති අමප/23/0147/613/002 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව, උතුර, නැගෙනහිර, උතුරු මැද පළාත්වල දිස්ත්‍රික්ක 10ක් හා මොණරාගල දිස්ත්‍රික්කය ඇතුළත්ව දිස්ත්‍රික්ක 11ක වනාන්තර මායිම් ගැටලු නිරාකරණය සිදු වන තෙක් වනාන්තර මායිම් මැනුම් කිරීම, සලකුණු කිරීම හා ගැසට් කිරීම අත්හිටුවීමට ජනාධිපතිතුමා විසින් ලබා දී ඇති වාචික නියෝගය අනුව 2023 වර්ෂයේදී ඉහත සඳහන් දෙපාර්තමේන්තු ඉලක්ක 1,2 හා 3 ඉටුකළ නොහැකි විය.එහෙයින් වන මායිම් මැනීම, මායිම් කිරීම සඳහා වූ කි.මී.20 ඉලක්කයද කි.මී.200 වනාන්තර මායිම් සලකුණු කර ඒවා සිතියම්ගත කර ගැසට්

කිරීමට නියමිතව තිබූ ඉලක්කයද සම්පූර්ණ කිරීමට නොලැබුණි.එහෙයින් දෙපාර්තමේන්තු ඉලක්ක 1හා 2 සම්පූර්ණ කිරීමට නොහැකි විය.

06.වන වගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රියාකාරකම ඉටු කිරීමට නොහැකි වීම

කැබිනට් පත්‍රිකාවට අදාල උතුර, නැගෙනහිර, උතුරු මැද පළාත්වල දිස්ත්‍රික්ක 10ක් හා මොණරාගල දිස්ත්‍රික්කය ඇතුළත්ව දිස්ත්‍රික්ක 11ක වනාන්තර මායිම් ගැටලු නිරාකරණය සිදු වන තෙක් වනාන්තර මායිම් මැනුම් කිරීම, සලකුණු කිරීම හා ගැසට් කිරීම අත්හිටුවීමට අදාල වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශයේ සියලු නිලධාරින් යෙදවීම නිසා වන වගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රියාකාරකම ඉටු කිරීමට නොහැකි විය.එහෙයින් දෙපාර්තමේන්තු ඉලක්ක 03 ඉටු කිරීමට නොහැකි විය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගුව 6. 1 : සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	89	40	49
තෘතීක මට්ටම	44	18	26
ද්විතීයික මට්ටම	1462	1171	291
ප්‍රාථමික මට්ටම	1634	1383	251
එකතුව	**3229**	**2612**	**617**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් බලපාන ආකාරය

ජ්‍යෙෂ්ඨ - දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති සැකසීම, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය හා පවත්වා ගැනීමේ හැකියාව කෙරෙහි දැඩි ලෙස බලපා ඇත

තෘතියික - දෙපාර්තමේන්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන කණ්ඩායම මෙහෙයවීම හා අධීක්ෂණය කෙරෙහි බලපෑම් ඇති කරයි.

ද්විතියික - වන ආරක්ෂණ හා සංවර්ධන කටයුතු ඵලදායි ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වීම.

ප්‍රාථමික - සුළු සේවක කාර්ය මණ්ඩලයක් නොමැතිකම හේතුවෙන් කාර්යාලීය කටයුතු කාර්යක්ෂමව කිරීමට නොහැක. වනාන්තර සහ නැවත වගාකරන වනාන්තරවල ආරක්ෂාවට මෙන්ම තවාන් කටයුතු හා සංරක්ෂණ මධ්‍යස්ථාන වල මෙම කාර්යාල කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට ගැටළු සහගත වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

2023 වසරේ බඳවා ගැනීම්

වගුව 6. 2 : 2023 වසරේ බඳවාගැනීම්

කාර්යාල කාර්ය සහායක	22
වගා කම්කරු	15
වගා මුරකරු	18
රසායනාගාර සහකාර	03
කාර්යාල මුරකරු	02
රිය සහායක	17
වන ක්ෂේත්‍ර සහායක	89

6.4 දේශීය/ විදේශීය පාඨමාලා

වගුව 6. 3 : දේශීය / විදේශීය පාඨමාලා

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු '000)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)		නිමැවුම/ ලබාගත්දැනුම
				දේශීය	විදේශීය	
නවක පත්වීම් ලද වන ක්ෂේත්‍ර සහකාරවරුන් සඳහා පුහුණුව ලබාදීම	100	දින 05	1213,650	දේශීය	-	වන ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ කාර්යභාරය පිළිබඳ හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා දැනුවත් කිරීම
තොරතුරු තාක්ෂණ නිලධාරින්2ක් සඳහා දින 2ක පුහුණු ලබාදීම	2	දින 02	19	දේශීය	-	තොරතුරු තාක්ෂණ නිලධාරින් හට තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදන හා ඇගයීම් පිළිබඳ සතු දැනුම වර්ධනය කිරීම.
රාජ්‍ය භාෂා දෙමළ පාඨමාලාව (පැය 150 පාඨමාලා 2)	200	පැය 150	225	දේශීය	-	කාර්යක්ෂමතා කඩයිම් සම්පූර්ණ කර ගැනීම සඳහා දෙමළ බස ප්‍රවීණත්වය ලබාගැනීම.
මාතර දිසාවන නිලධාරි කාර්යාලයේ නිලධාරින් හට SMART කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව ලබාදීම	30	දින 01	50	දේශීය	-	එදිනෙදා කාර්යාල ක්‍රම සඳහා SMART ක්‍රම යොදාගැනීම වැඩිකිරීම.
භූවිද්‍යා තොරතුරු හා වන සංගණන අංශයේ නිලධාරින්ට QGISපුහුණුවක් ලබාදීම	60	දින 02	55	දේශීය	-	QGIS වැනි නව යෙදවුම් වන සංගණන ක්‍රියාවලියට යොදාගැනීම
01. Regional Workshop on Forest Genetic Resources	2	04	-	-	විදේශීය	කලාපයේ ජාන සම්පත් සංරක්ෂණය සඳහා සහයෝගීතාවය වර්ධනය කර ගැනීම.
02. Workshop on Landscape	1	04	-	-	විදේශීය	භූ දර්ශන ප්‍රතිස්ථාපනය පිළිබඳ

Restoration and International Symposium on Intersectoral Cooperation for Resilient Landscapes						අත්දැකීම් හුවමාරු කර ගැනීම.
03. Forest Resources Assessment (FRA) 2025 National Correspondents Workshop for Asian Countries	1	04	-	-	විදේශීය	ලෝක වන සම්පත් සංගණනයට දායක වීම.
04. 7th Asia Pacific Network for Sustainable Forest Management and Rehabilitation (APFNET) Council Meeting	1	04	-	-	විදේශීය	තිරසර වනාන්තර කළමණාකරනය සඳහා කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීම.
05. 7th APAP Technical Workshop	2	04	-	-	විදේශීය	තිරසර වනාන්තර කළමණාකරනය සඳහා කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීම.
06.Ministerial Workshop on Sustainable Forest Development under South - South Cooperation for Developing Countries	3	07	-	-	විදේශීය	වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරි පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා චීන - ශ්‍රී ලංකා සහයෝගීතාවය වර්ධනය කරගැනීමට හැකිවීම.
07. First Pu'er Fourm on Asia	2	05	-	-	විදේශීය	තිරසර වනාන්තර කළමණාකරනය සඳහා කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීම.
08. Second Global Forest Resource Assessment 2025 (FRA 2025) Workshop	1	04	-	-	විදේශීය	ලෝක වන සම්පත් සංගණනයට දායක වීම.
09. International training course on national capacity development in forest genetic resources	2	15	-	-	විදේශීය	ජාන සම්පත් සංවර්ධනය සඳහා හැකියාවන් වර්ධනය කිරීම.

10. Seminar on Forestry Project Development for the Belt and Road Initiative Countries	2	21	-	-	විදේශීය	අදාල ක්ෂේත්‍රයේ දැනුම හා හැකියාවන් සංවර්ධනය කිරීම උදෙසා විවිධ රටවල අත්දැකීම් බෙදා ගැනීමට හැකිවීම, අදාල ක්ෂේත්‍රයේ නියැලෙන විශේෂඥ දැනුමැති පුද්ගලයන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට හැකිවීම.
11. Training on the Implementation of United Nations Forest Instrument (UNFI) & Sustainable Forest Management for Developing Countries	4	21	-	-	විදේශීය	
12. Seminar on Import & Export Management & Protection of Endangered Species for Officials	4	21	-	-	විදේශීය	
13. Seminar on Tourism Management for Sri Lanka	1	14	-	-	විදේශීය	ශ්‍රී ලංකාවේ හා දියුණුවන රටවල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබාගැනීම.
14. Seminar on Tourism Promotion for Developing Countries	1	21	-	-	විදේශීය	ශ්‍රී ලංකාවේ හා දියුණුවන රටවල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබාගැනීම.
15. Seminar on Implementation of United Nations Conservation to Combat Desertification (UNCCD) and Sandstorm Prevention for Senior officials from BRI Countries	5	21				කාන්තාරීකරණය හා වැලිකුණාටු වැළක්වීම සඳහා එක්සත් ජාතීනගේ වැඩසටහන පිළිබඳ දැනුවත් වීම.
16.Seminar on Comprehensive Development and Utilization of Mountain Areas for BRI Countries	2	21	-	-	විදේශීය	කඳුකර ප්‍රදේශ සංවර්ධනය පිළිබඳව දැනුම හුවමාරු කරගැනීම.

6.5 2023 වසරේ විශ්‍රාම ගැනීම්

අදාළ කාල වකවානුව තුළ පහත සඳහන් තනතුරු දරණ ලද නිලධාරීන් විශ්‍රාම ගන්නා ලදී.

වගුව 6. 4 : 2023 වසරේ විශ්‍රාම ගැනීම්

වන සංරක්ෂක ජනරාල්	01
වන සංරක්ෂක	01
නියෝජ්‍ය වන සංරක්ෂක	01
සහකාර වන සංරක්ෂක	04
ප්‍රධාන ගණකාධිකාරි	01
විශේෂ වන පාලක	04
අඩවි වන නිලධාරී	06
කළමනාකරණ සේවා නිලධාරි	04
බීට්ටු වන නිලධාරී	05
වන ව්‍යාප්ති නිලධාරී	01
රියදුරු	01
වන ක්ෂෙත්‍ර සහකාර	18
කාර්යාල කාර්ය සහයක	01
වගා කම්කරු	01
වගා මුරකරු	01
සනීපාරක්ෂක කම්කරු	01

6.6 සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුරු වලින් නිදහස් වීම

වගුව 6. 5 : සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරු වලින් නිදහස් වීම

ගණකාධිකාරි	01
සංවර්ධන නිලධාරි	02
කාර්යාල කාර්ය සහායක	01
වන ක්ෂේත්‍ර සහකාර	02

6.7 මියගිය නිලධාරින් පිළිබඳ විස්තර

වගුව 6. 6 : මියගිය නිලධාරින් පිළිබඳ විස්තර

රියදුරු	01
වගා කම්කරු	01
වන ක්ෂේත්‍ර සහකාර	01

6.8 විනය කටයුතු

වගුව 6. 7 : විනය කටයුතු

වැඩ තහනම් කිරීම්	04
නැවත සේවයේ පිහිටුවීම	05
වර්ෂය තුළ ආරම්භ කළ විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ	32

6.9 සේවය අත්හැර යාම්

වගුව 6. 8 : සේවය අත්හැර යාම්

සංවර්ධන නිලධාරි	01
කාර්යාල කාර්ය සහායක	03
වන කේෂ්ත්‍ර සහකාර	06
සංචාරක බංගලා භාරකරු	01
වගා කම්කරු	01

6.10 දෙපාර්තමේන්තු විභාග

1.අඩවි වන නිලධාරි(ඉහළ මට්ටම), බීට්ටු වන නිලධාරි(මධ්‍යම මට්ටම), වන කේෂ්ත්‍ර සහකාර (ප්‍රාරම්භක මට්ටම) තනතුරු සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වන නීතිය) - 2023.08.12

2.ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2023.10.20

6.11 පුහුණු වැඩසටහන්

වගුව 6. 9: පුහුණු වැඩසටහන්

වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව (දින)	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත්දැනුම
			දේශීය	විදේශීය		
ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන	170	පැය 03 1/2	-		-	අදාල කේෂ්ත්‍රයට අයත් දැනුම
ඵලදායිතාව පිළිබඳ මාර්ගගත වැඩසටහන	180	දිනකට පැය 02 බැගින් වූ වැඩසටහන් 12	-		-	
පරිපාලන නිලධාරින් සහ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරින් සඳහා වූ පුහුණු වැඩසටහන	29	දින 03	-		-	
Seminar on the Protection and Management of National Heritage Sites for	40	24			මාර්ගගතව	ජාතික උරුම කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳව වෙනත්

B&R Initiative Countries,						රටවල දැනුම හුවමාරු කරගැනීම.
Seminar on Nature Reserve Management and Protection for Belt and Road Initiative Countries	16	14			මාර්ගගතව	වන කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳව වෙනත් රටවල දැනුම හුවමාරු කරගැනීම.
Seminar on Natural Forest Protection for Developing Countries	14	25			මාර්ගගතව	වන කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳව වෙනත් රටවල දැනුම හුවමාරු කරගැනීම.
Seminar on Forest Products Processing Techniques and Sustainable Management for Developing Countries,	13	21			මාර්ගගතව	වනජ ද්‍රව්‍ය සැකසීම හා තිරසර කළමනාකරණය පිළිබඳ දැනුම හුවමාරු කරගැනීම.
Seminar on Protection and Utilization Planning of Forest Resources for BRI Countries	10	14			මාර්ගගතව	වන සම්පත් ආරක්ෂණය හා භාවිතය පිළිබඳ දැනුම වර්ධනය කරගැනීම.

6.12 ණය ලබාදීම

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට අයත් නිලධාරින්ට රජයේ සේවකයන්ට හිමි ණය යටතේ පහත සඳහන් ණය ලබා දී ඇත.

1. ආපදා ණය 59ක්
2. දේපල ණය ලබා දී නැත.

6.13 තොරතුරු අයිතිවාසිකම් ඒකකය

1.මෙම දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන් පහත පරිදි වර්ග කළ හැක.

- පුරවැසියන් - 51
- රාජ්‍ය සංවිධාන - 2
- රාජ්‍ය නොවන සංවිධාන - 29

82

2. ඉල්ලුම් කළ තොරතුරු පහත පරිදි වර්ගීකරණය කළ හැක

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉඩම් පිළිබඳ ගැටළු - 14
- වන රක්ෂිත පිළිබඳ ගැටළු - 15
- කාර්යය මණ්ඩල ආයතන අංශයේ ගැටළු - 22
- වන ආරක්ෂණය, නීති සම්බන්ධ ගැටලු - 15
- විවිධ තොරතුරු ලබා ගැනීම - 16

82

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

වගුව 7. 1 : අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූලනොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලිකිරීම	අනුකූලනොවී මඅනාගතයේදී වළක්වාගැනීම ටයෝජනාකර නනිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම්/ ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	-	-
1.6	වෙනත්	අනුකූල වේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව වත්කම්ලේඛනයයාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.9	භානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11දිනැතිඅංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේපාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට,සියලුමවිගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ .134 (2)DMA/1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	ඇතැම් අවස්ථාවන්හිදී මාසක කාලයක් තුල පිළිතුරු නොලැබීම	නියමිත කාලය තුලදී පිළිතුරු ඉදිරිපත් කරන ලෙස අංශ දැනුවත් කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව ,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 2017/01 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන්අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිතවාහන සඳහා දෛනික ධාවනසටහන් හා මාසිකසාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිතවී මාස06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග්පොත් පවත්වාගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරවකටයුතුකිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ	-	-

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කරතිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණයශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ණය හිමියන් සහ ඇපකරුවන් සොයා ගැනීම දුෂ්කර විය.සමහර නිලධාරින් මරණයට පත්වීම,වැඩ තහනමට ලක් වීම,සේවය අත්හිටුවීම ආදී කරුණු හේතුවිය.	ණය හිමියන් හෝ ගනුදෙනුකරුවන් සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීම.
13	**පොදුතැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ571 . ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වා ර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අනුමත කාර්යය මණ්ඩලය වන.සං.දෙ. වෙත නොලැබීම	පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර අවශ්‍ය අනුමැතිය ඉල්ලුම් කර ඇත.
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 2017/04 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ	වෙබ් අඩවිය යාවත්කාලීන කර නොමැත	තොරතුරු තාක්ෂණ ඒකකය හරහා අදාල කටයුතු සිදු කරමින් පවතී.
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 2008/05 හා 2018/05(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	-	-

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2018/02 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛ 6.5ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම	අනුකූල වේ	-	-